

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

කාර්ය සාධන වාර්තාව - 2025

වැය ශීර්ෂය - 297

පටුන

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර
1.3 අරමුණු හා ප්‍රධාන කාර්යයන්
1.4 දෙපාර්තමේන්තුවේ විධායක හා මාණ්ඩලික නිලධාරි මණ්ඩලය
1.5 සංවිධාන සටහන
1.6 දෙපාර්තමේන්තුවේ ව්‍යුහය
1.7 සමාගම් අරමුදල

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ
2.2 අභියෝග
2.3 ඉදිරි ඉලක්ක

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය
3.7 මු.රෙ.208 ප්‍රකාරව, මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය
6.3 මානව සම්පත් සංවර්ධනය

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

01. ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සමාගම් ලියාපදිංචිය 1861 දී සංයුක්ත ස්කන්ධ සමාගම් ආඥාපනතින් ආරම්භ කර ඇති අතර 1948 පෙබරවාරි 04 වැනිදා දක්වා පැවති ඉංග්‍රීසි පාලන කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ සමාගම් ලියාපදිංචිය 1897 සංයුක්ත ස්කන්ධ බද්ධ ආඥාපනත යටතේ සිදු කර ඇත.

එයින් පසු 1938 අංක 51 දරණ සමාගම් ආඥාපනත යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව පිහිටුවා, එම දෙපාර්තමේන්තුවට වෙළෙඳ ලකුණු ආඥාපනත, ව්‍යාපාර නාම ආඥාපනත, සීට්ටු ආඥාපනත හා සමිති ආඥාපනත ක්‍රියාත්මක කිරීමේ වගකීමද පවරා ඇත. මේ අතරින් වෙළෙඳ ලකුණු ආඥාපනත ක්‍රියාත්මක කිරීමේ වගකීම 1980 වර්ෂයේදී පිහිටවූ ජාතික බුද්ධිමය දේපළ දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති අතර අනෙකුත් ආඥාපනත් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක විය.

නිදහසින් පසුව ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ක්ෂේත්‍රය දේශීය අනන්‍යතාවයකින් යුක්තව ගොඩනැගුණු අතර ඊට පහසුකම් සපයමින් 1982 වර්ෂයේ සිට 1982 අංක 17 දරණ සමාගම් පනත ක්‍රියාත්මක විය. ශ්‍රී ලංකාවේ ආර්ථිකය පුළුල්වීමත්, ආයෝජකයින් විශාල ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට පහසුකම් ලබාදීමත් සැලකිල්ලට ගෙන වසර 25ක් පමණ ක්‍රියාත්මක වූ එකී පනත තවදුරටත් සරල කරමින් 2007 අංක 07 දරණ සමාගම් පනත අනුමත වී ඇති අතර ඒ යටතේ සමාගම් ලියාපදිංචිය ඇතුළු සමාගම් සම්බන්ධ කටයුතු මේ වන විට සිදු කරනු ලබයි.

එසේම දෙපාර්තමේන්තුව වෙත පැමිණ තමාට අවශ්‍ය සේවා සපයා ගැනීමේදී ජනතාවට සිදුවන අපහසුතා සඳහා විසඳුමක් වශයෙන් 2018 වර්ෂයේ දී සමාගම් සංස්ථාපනය කිරීම e-ROC ව්‍යාපෘතිය හරහා මාර්ගගත ක්‍රමයට සිදු කිරීම ආරම්භ කරන ලදී. එයින් පසුව විවිධ යාවත්කාලීන කිරීම්, අළුත්වැඩියා කිරීම්, වැඩිදියුණු කිරීම් සිදුකරමින් සමාගමක නාමය අනුමත කිරීමේ සිට සමාගම් ඇවර කිරීම දක්වා සමාගම් සම්බන්ධ සියළු කටයුතු e-ROC පද්ධතිය හරහා මාර්ගගත ක්‍රමයට එසැනින් සේවා සපයන රජයේ දෙපාර්තමේන්තුවක් බවට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව මේ වන විට පත් වී ඇත.

1.2 ආයතනයේ දැක්ම හා මෙහෙවර

දැක්ම

ශ්‍රී ලංකාවේ ව්‍යාපාර අංශ ආවරණය කරමින් සංස්ථා යහපාලනය පිළිබඳව හැදියාවක් ක්‍රම ක්‍රමයෙන් බිහි කිරීමට සමත් සක්‍රීය නියාමන අධිකාරියක් ඇති කිරීම තුළින් විශ්වාසනීය ව්‍යාපාරික පසුබිමක් සංවර්ධනය කිරීම හා පෝෂණය කිරීම.

මෙහෙවර

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව රජයේ ආර්ථික ප්‍රතිපත්තියට හා වෙළෙඳ ප්‍රතිපත්තියට අනුකූලතාවයක් ඇති වන සේ අදාළ පනත් යටතේ ව්‍යාපාර හා අනෙකුත් ආයතන සඳහා නීතිමය තත්ත්වයක් ලබා දීමට හා ඒවායේ කාර්යයන් ක්‍රමවත් කිරීමට පරිශ්‍රමයක් දරයි.

1.3 <u>අරමුණු හා ප්‍රධාන කාර්යයන්</u>

අරමුණු

- 2007 අංක 07 දරණ සමාගම් පනත
- සමිති ආඥාපනත - 123 වන අධිකාරිය
- 1935 අංක 61 දරණ සීට්ටු ආඥාපනත
- 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත

මගින් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති මුලික කාර්යයන් ඉටු කිරීම, නියාමනය හා මෙහෙයවීම.

ප්‍රධාන කාර්යයන්


- පෞද්ගලික සමාගම්, පොදු සමාගම්, ඇපයෙන් සීමිත සමාගම්, සීමා රහිත සමාගම් , සහ ලැයිස්තුගත සමාගම් සංස්ථාපනය කිරීම.
- විදේශීය සමාගම් සහ අක්වෙරළ සමාගම්, සමිති, පොදු කොන්ත්‍රාත්, උකස්බැඳුම්කර, ඍණපත්‍ර, ගණන් පරීක්ෂකවරුන් සහ සමාගම් ලේකම්වරුන් ලියාපදිංචි කිරීම.
- සමාගම් පනත සහ සමිති ආඥා පනත අනුව සමාගම් සහ සමිති වල තොරතුරු යාවත්කාලීන කිරීමට අදාල ලේඛන ලියාපදිංචි කිරීම.
- සමාගම් ඇවර කිරීම හා විසුරුවා හැරීම
- සමාගම්/සමිති වලට අදාල සියළුම තොරතුරු යාවත්කාලීන කිරීම
- සහතික පිටපත් නිකුත් කිරීම, මහජනතාව වෙත තොරතුරු ලබා දීම.
- ලේඛන තහවුරු කිරීම.
- ගාස්තු එකතු කිරීම හා සැසඳීම.
- රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත අවශ්‍ය තොරතුරු, සහතික පිටපත් ලබා දීම හා අවශ්‍ය සහාය ලබා දීම.



1.4 <u>දෙපාර්තමේන්තුවේ විධායක හා මාණ්ඩලික නිලධාරි මණ්ඩලය</u>

01.	කේ.ඒ.පී.ද සිල්වා මිය	-	සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (වැ.බ.)
02.	පී.පී. ශ්‍යාමා හර්ෂණී මිය	-	සමාගම් රෙජිස්ට්‍රාර්
03.	එල්.කේ.එස්.ධර්මකීර්ති මිය	-	සමාගම් රෙජිස්ට්‍රාර්
04.	ජෙයවානි සුසාන්තකුමාර් මිය	-	අභ්‍යන්තර විගණක I
05.	බී.ඒ.ආර්.එන්. බාලසූරිය මිය	-	ගණකාධිකාරි I
06.	ආර්.කේ.කේ.සිරිවර්ධන මයා	-	අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) පූර්ණකාලීනව රාජකාරී ඉටුකිරීම
07.	පී.එස්.ඩී.තරංග පණ්ඩිත සුන්දර මයා	-	නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්
08.	කේ.එච්.ශේන් ශ්‍රී නිලූෂ ද සිල්වා මයා	-	සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්
09.	ආර්.ආර්.එස්.සී.රත්නායක මයා	-	සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් /නිලහාර ගැනුම්කරු (වැ.බ.)
10.	එම්.ඩී.එච්.එස්.මතුගමගේ මයා	-	සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්
11.	එම්.වී.අයි.එස්.දිසානායක මිය	-	සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන) වැ.බ.
12.	කේ.ඩබ්.එන්.එස්.පෙරේරා මයා	-	සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)
13.	ජී.ආර්.ඩී.එච්.කරුණාතිලක මිය	-	සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්
14.	ජී.එම්.එස්. පුෂ්පකුමාර මයා	-	සංඛ්‍යාලේඛනඥ
15.	සී.ඩී.පනාගොඩ මිය	-	පරිපාලන නිලධාරී
16.	ඒ.ඒ.ටී.කේ.කේ.අමරසිංහ මෙය	-	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
17.	එම්.බී.ටී.අංජලී මෙය	-	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී

1.5 සංවිධාන සටහන



1. ICTO – Information & Communication Technology Officer
2. DO – Development Officer
3. CIO – Companies Inspector Officers
4. MSO –Management Service Officer
5. ICTA – Information & Communication Technology Assistant
6. OES – Office Employees Service

1.6 <u>දෙපාර්තමේන්තුවේ ව්‍යුහය.</u>

i. තොරතුරු සැපයීමේ අංශය

ii. සමාගම් A අංශය

iii. සමාගම් වල තොරතුරු යාවත්කාලීන කිරීමේ හා ලේඛන ලියාපදිංචි කිරීමේ අංශ

a. සමාගම් B අංශය

b. සමාගම් C අංශය

c. සමාගම් D අංශය

d. සමාගම් E අංශය

e. සමාගම් F අංශය

iv. ඈවර කිරීමේ අංශය

v. සමිති ලියාපදිංචි කිරීමේ අංශය

vi. සමාගම් ලේකම්වරු සහ විගණකවරු ලියාපදිංචි කිරීමේ අංශය

vii. පොදු කොන්ත්‍රාත් (ටෙන්ඩර්) අංශය

viii. ලේඛනාගාරය සහ විමර්ශන ශාලාව

ix. සමාගම් පරීක්ෂක අංශය

x. ආයතන අංශය

xi. ගිණුම් අංශය

xii. අභ්‍යන්තර විගණන අංශය

xiii. තොරතුරු තාක්ෂණ අංශය සහ පාරිභොගික සේවා අංශය

i. **<u>තොරතුරු සැපයීමේ අංශය</u>**

මහජන විමසීම් සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමට හැකියාව ඇති මනාව පුහුණුව ලැබූ සහ අත්දැකීම් සහිත නිලධාරියකු විසින් තොරතුරු සැපයීමේ අංශයේ සේවය සැපයීම සිදු කරනු ලබයි. දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වන මහජනයා වෙත අවශ්‍ය වන තොරතුරු ලබා දීම හා මගපෙන්වීම මෙම අංශයෙන් සිදුකරනු ලබන අතර එමඟින් මහජනතාවට දෙපාර්තමේන්තුවෙන් සේවාවන් සපයාගැනීම පහසු කරයි. එමෙන්ම සේවාලාභීන් විසින් භාර දෙන ලේඛන පරික්ෂාකර අදාල අංශ වෙත යොමු කිරීමත් මෙමඟින් සිදු කරයි.

ii. **<u>සමාගම් A අංශය</u>**

- **සමාගම් නාම අනුමත කිරීම**


සමාගමක් විසින් නමක් අයදුම් කිරීමට අයදුම්පතක් ඉදිරිපත් කළ පසු දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය පරික්ෂා කර බලා, එම නමට අනුමැතිය ලබා දීම සමාගම් පනතට හා නාමය අනුමත කිරීමේ රීතීන්ට අනුකූලදැයි වාර්තා කිරීම, මහජනතාවට, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට සමාගම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට සහය වීමත්, සමාගම් වලට අදාළව ලියාපදිංචි අංකයන් ලබා දීම සහ යම් නමක් යටතේ සමාගමක් දැනටමත් සංස්ථාපනය කර ඇද්ද යන්න වාර්තා කිරීම මෙම අංශය විසින් සිදු කරනු ලබයි.

- **නව සමාගම් සංස්ථාපනය කිරීම**

සමාගම් සංස්ථාපනය කිරීමට අදාළව මාර්ගගත ක්‍රමය ඔස්සේ ලැබෙන අයදුම්පත් වල නිරවද්‍යතාවය පරික්ෂා කර බලා නිවැරදි ලේඛන ලියාපදිංචියට ඉදිරිපත් කිරීම සහ දෝෂ සහිත ලේඛන වල අඩුපාඩු කවරේදැයි අදාළ පාර්ශව වෙත දැන්වීම, සමාගම් සංස්ථාපනය සම්බන්ධයෙන් වන මහජනතාවගේ ගැටළු වලට විසඳුම් ලබා දීම, නිවැරදි කර එවන අයදුම්පත්‍ර පරීක්ෂා කර බලා නිවැරදි නම් ලියාපදිංචි කිරීමට කටයුතු කරනු ලබයි.

විස්තරය	භෞතික		
	2023	2024	2025
නාම අනුමත කිරීමට ඉදිරිපත් කළ අයදුම්පත් සංඛ්‍යාව	33,223	42,350	50,118
සමාගම් නාමයන් අනුමත කළ සංඛ්‍යාව	32,252	39,205	53,874
ප්‍රතික්ෂේප වූ අයදුම්පත් සංඛ්‍යාව	186	1,960	235

***** *මෙහිදී 2025 වර්ෂය තුළ නාම අනුමත කිරීමට ඉදිරිපත් වී ඇති අයදුම්පත් සංඛ්‍යාවට වඩා නාමයන් අනුමත කර ඇති සංඛ්‍යාව වැඩි වී ඇත්තේ පසුගිය වර්ෂයේ ඉදිරිපත් වූ අයදුම්පත් ද 2025 වර්ෂයේ අනුමත වී ඇති බැවිනි.*



iii. **<u>සමාගම් වල තොරතුරු යාවත්කාලීන කිරීමේ හා ලේඛන ලියාපදිංචි කිරීමේ අංශ</u>**

සමාගම්වල තොරතුරු යාවත්කාලීන කිරීම හා ලේඛන ලියාපදිංචි කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වේ . එය සමාගම් B, C, D, E හා F අංශ මඟින් සිදු කරනු ලබයි.

a. සමාගම් B අංශය හා සමාගම් C අංශය

2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන සමාගම් විසින් මාස 18 ක කාලය ඇතුළත වාර්ෂික මහ සභා රැස්වීම් පවත්වා වාර්ෂික වාර්තාව ගොනු කළ යුතු අතර ඉන් පසුව ගොනු කරනු ලබන සෑම වාර්ෂික වාර්තාවක්ම පූර්ව වාර්ෂික වාර්තාවෙන් මාස 15කට වඩා පසු නොවන කාලයක් තුළදී සෑම ලිත් වර්ෂයක් සඳහාම සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කළ යුතුය. එලෙස ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තා පරීක්ෂා කිරීම, අඩුපාඩු ඇතොත් දන්වා යැවීම, අවලංගු කිරීම හෝ අඩුපාඩුවක් නොමැති නම් ලියාපදිංචි කිරීම සඳහා **ආකෘති පත්‍ර 15** ලේඛන පරීක්ෂා කිරීම සමාගම් B අංශය හා සමාගම් C අංශය මඟින් සිදු කරනු ලබයි.

b. සමාගම් D අංශය

2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති පුද්ගලික සමාගම්, පොදු සමාගම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ලේකම්වරුන්ගේ/ ලේකම් සමාගමේ සිදු කරනු ලබන සියළුම වෙනස්කම් යාවත්කාලීන කිරීම මෙම

අංශය මගින් සිදු කරනු ලබන අතර සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සියළුම සමාගම්වල වෙනස්කම් වැඩ කරන දින 20ක් ඇතුළත **ආකෘති පත්‍ර 20** (Form 20) මඟින් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත දැනුම්දීමට අදාළ සමාගම් කටයුතු කළ යුතුවේ. ඒ අනුව මෙම ක්‍රියාවලිය මේ වන විට මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කළ හැකි අතර ,

- අධ්‍යක්ෂවරුන් ඉවත් කිරීම/ ඉල්ලා අස්වීම
- සමාගම් ලේකම් ඉවත් කිරීම/ ඉල්ලා අස්වීම
- අධ්‍යක්ෂ මණ්ඩලයේ / ලේකම්වරුන්ගේ/ ලේකම් සමාගමේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංක හෝ ගමන් බලපත්‍ර අංක, විද්‍යුත් තැපැල් ලිපින වෙනස්වීම

යන වෙනස්කම්වලට අදාළව ඉදිරිපත් කරනු ලබන ආකෘති පත්‍ර පරීක්ෂා කර බලා අඩුපාඩු ඇතොත් එම අඩුපාඩු පිළිබඳවත් ඒවා නිවැරදි කරන ආකාරයත් දන්වා ආපසු යැවීම හෝ ඒවා අවලංගු කිරීමත් , අදාළ අයදුම්පත් නිවැරදි නම් ලියාපදිංචියට ඉදිරිපත් කිරීමත් මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

c. සමාගම් E අංශය

2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සමාගම් විසින්,

- තම සමාගමේ කොටස් ප්‍රාග්ධනය පුළුල් කර ගැනීම **ආකෘති පත්‍ර 06** ලේඛනය ද,
- සමාගම් විසින් නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයේ වටිනාකම අඩුකිරීම සඳහා **ආකෘති පත්‍ර 08** ලේඛනය ද ,
- සමාගම විසින් කොටස්කරුවන්ට නිකුත් කළ කොටස් පවරා ගැනීම සඳහා **ආකෘති පත්‍ර 09** ලේඛනය ද ,
- සමාගම සංස්ථාපනය කර ඇති ස්ථානයේ ලිපිනය වෙනත් ස්ථානයකට මාරු කිරීම සඳහා **ආකෘති පත්‍ර 13** ලේඛනය ද , මඟින්

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත දැන්විය යුතු අතර ඒ සඳහා මාර්ගගත ක්‍රමය යටතේ ඉදිරිපත් කරනු ලබන උක්ත සඳහන් ලේඛන පරීක්ෂා කර බලා අදාළ අඩුපාඩු දැන්වීම, ඒවා අවලංගු කිරීම හෝ නිවැරදි නම් ලියාපදිංචිය සඳහා යොමුකිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

d. සමාගම් F අංශය

සමාගම් සම්බන්ධව ලැබෙන පහත සඳහන් ආකෘති පත්‍රවලට අදාළව ක්‍රියා කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

- සමාගමක නාමය වෙනස් කිරීම - **ආකෘති පත්‍ර 03**
- සමාගමක වාර්තා හා ලියාපදිංචි ලේඛන තබා ඇති ලිපිනය වෙනස් කිරීම - **ආකෘති පත්‍ර 14**
- සමාගමක ගිණුම් වාර්තාවල ශේෂ පත්‍ර දිනය වෙනස් කිරීම - **ආකෘති පත්‍ර 17**
- සමාගමක පරිපාලකයන් පත් කිරීම - **ආකෘති පත්‍ර 34**
- සමාගමක සංස්ථාවලිය වෙනස් කිරීම - **ආකෘති පත්‍ර 39**
- Prospectus
- සමාගමක වාර්ෂික ගිණුම් වාර්තා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම(Annual Accounts)
- Prior Approvals
- සමාගම් ඒකාබද්ධ කිරීම (Amalgamations)
- උසාවි නියෝග (Court Orders)
- විදේශ සමාගම්, අක්වෙරළ සමාගම්, වරාය නගර සමාගම් ලියාපදිංචි කිරීම හා එම සමාගම්වල වෙනස් කිරීම්වලට අදාළ වන ආකෘති පත්‍ර - **ආකෘති පත්‍ර 35** **ආකෘති පත්‍ර 37** **ආකෘති පත්‍ර 23**
- විදේශ සමාගම් ඈවර කිරීම (Strike Off)

iv. <u>**ඈවර කිරීමේ අංශය**</u>

මෙම අංශය මඟින් සමාගම්වල නාමය කපාහැරීම හා සමාගම් විසුරුවා හැරීම සම්බන්ධව පහත ආකාරයෙන් කටයුතු කරනු ලබයි.

01. 2007 අංක 07 දරණ සමාගම් පනතේ 394 වගන්තිය යටතේ නාමය කපා හැරීම.

- ***වත්කම් වගකීම් නොමැති සමාගම් වල නාමයන් කපා හැරීම.***

මෙහිදී සමාගම් නාමය කපා හැරීමට සියළුම අධ්‍යක්ෂවරුන්ගේ හා අධ්‍යක්ෂ නොවන කොටස් හිමියන්ගේ දිවුරුම් ප්‍රකාශ හා ඉල්ලීම් ලිපියක් ලබාගන්නා අතර ඉන් පසු එම දිවුරුම් ප්‍රකාශ සඳහා නියෝග ලබා ගැනීමට ඉදිරිපත් කරනු ලබයි. ඉන්පසු සමාගම් 9 (සමාගමට) සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත විමසීම් ලිපි සකස් කරන අතර එම ලිපියේ දින සිට මසක් සහ දින 10ක කාලය තුල සමාගම් 10 සහ සමාගම් 04 ලිපි සකසනු ලබයි. දේශීය ආදායම්

කොමසාරිස් ජනරාල්ගේ විරෝධතාවයක් නොමැත්තේ නම් භාෂාත්‍රයෙන් ගැසට් නිවේදනය නිකුත්කර එය ප්‍රකාශයට පත්වී මාස 03ක කාලයකින් අනතුරුව සමාගමේ නාමය කපා හැරීම සිදු කරනු ලබයි.

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් විරෝධතා දක්වන සමාගම් සම්බන්ධයෙන් අදාල සමාගම දැනුවත් කිරීමට කටයුතු කර එකී විරෝධතාවය අවසන් වන තුරු සමාගම් නාමය කපා හැරීම වළවක්වනු ලැබේ.

- ***වාර්ෂික වාර්තා ගොනු කර නොමැති සමාගම් සම්බන්ධයෙන් එම සමාගම් දැනුවත් කිරීමෙන් අනතුරුව ඊට ප්‍රතිචාර නොදක්වන්නේ නම් සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ විරෝධතාවයක් නොමැති නම් දරණ 07 අංක 2007 වගන්තිය යටතේ එකී සමාගම්වල නාමය කපා හැරීමට 394 සමාගම් පනතේ කටයුතු කරනු ලැබේ.***

02. වත්කම් වගකීම් පවතින සමාගම් සම්බන්ධයෙන් ඇවරකරුවෙකු පත් කිරීමෙන්

- සාමාජිකයන්ගේ ස්වෙච්ඡාවෙන්
- ණය හිමියන්ගේ ස්වෙච්ඡාවෙන්
- අධිකරණ නියෝගයකින්

යන තුන් ආකාරයෙන් එක් ආකාරයකට සමාගම විසුරුවා හැරීම සිදු කරනු ලබයි. මෙහිදී ගොනු කරන ලේඛන ලියාපදිංචි කරන අතර අවසන් ලේඛනය ලියාපදිංචි කර මාස 03කින් පසු සමාගම විසුරුවා හැරීම සිදු කරනු ලබයි. අධිකරණ නියෝගයකින් ගණන් බෙරා විසුරුවා හරින විට අවසන් අධිකරණ නියෝගය ලියාපදිංචි කිරීමෙන් පසු විසුරුවා හැරීම සිදු කරනු ලබයි.

03. සමාගම් ඒකාබද්ධ කිරීමෙන් පසු එම සමාගම් වල නාමයන් කපා හැරීමට කටයුතු කිරීම.


04. සමාගම් වල නාමයන් කපා හැරීම පරීක්ෂා කිරීමට දෛනිකව පැමිණෙන සේවාදායකයන්ගේ ඉල්ලීම්වලට අදාළ ලේඛන නිකුත් කිරීම.

05. මාර්ගගත ක්‍රමය ඔස්සේ ද මේ වන විට නාමය කපා හැරීමේ කටයුතු සිදු කරනු ලබයි.

06. තවද නාමය කපා හැරීමට දිවුරුම් ප්‍රකාශ ලබා දුන්නද ඉන් පසුව සමාගම පවත්වා ගෙන යාමට අවශ්‍ය සමාගම් වලින් දිවුරුම් ප්‍රකාශ ලබාගෙන නාමය කපා හැරීමේ නියෝග අවලංගු කිරීමට කටයුතු කිරීම.

විසුරුවා හැර ඇති සහ අවලංගු කර ඇති සමාගම් සංඛ්‍යාව (2025.12.31 දක්වා)

	2022	2023	2024	2025
සාමාජිකයින් ස්වේච්ඡාවෙන් ඇවර කිරීම	27	31	48	23
ණයහිමියන් ස්වේච්ඡාවෙන් ඇවර කිරීම	05	7	08	06
අධිකරණයෙන් ඇවර කිරීම	04	6	07	03
පනතේ 394 යටතේ නම කපා හැරීම	212	711	373	205
ඒකාබද්ධ කිරීම හේතුවෙන් නම කපා හැරීම	4	30	58	26
විදේශ සමාගම්වල නාමය කපා හැරීම	13	19	14	08
එකතුව	265	804	508	271



v. සමිති ලියාපදිංචි කිරීමේ අංශය


සමිති අංශයේ මූලික අරමුණ වනුයේ 1891 අංක 16 දරණ සමිති ආඥා පනත යටතේ වන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම වන අතර මෙම අංශයට අයත් මූලික කාර්යභාරය වනුයේ 1891 අංක 16 දරන සමිති ආඥා පනත යටතේ නව සමිති ලියාපදිංචි කිරීම හා සමිතිවලට අදාළ ව්‍යවස්ථා සංශෝධන ලියාපදිංචි කිරීම වේ. ඒ අනුව ඒ යටතේ පහත කාර්යයන් සිදු කරනු ලැබේ.

- මාර්ගගත ක්‍රමය ඔස්සේ නව එක් සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත හා ව්‍යවස්ථාව ඇතුළුව ලේඛන 22ක් ලැබෙන අතර එම සියළු ලේඛන පරීක්ෂා කර බලා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් විසින් ලියාපදිංචි කිරීම

සිදු කරන අතර ඇතැම් සමිති සඳහා සාමාන්‍ය ක්‍රමය යටතේ ගොනුවක් සකස් කර අමාත්‍ය අනුමැතිය සඳහා යොමු කිරීම සිදු කරනු ලැබේ.

- නව සමිති ලියාපදිංචි කිරීම සඳහා මහජනතාවට අවශ්‍ය උපදෙස් ලබා දීම.
- ව්‍යවස්ථා සංශෝධන සඳහා ලැබෙන ලේඛන පරීක්ෂා කර ව්‍යවස්ථා සංශෝධන සිදු කිරීම.
- ලියාපදිංචි කර ඇති සමිතිවලට අදාලව ඉදිරිපත් කෙරෙන වාර්ෂික වාර්තා ගොනු කිරීම හා වාර්ෂික වාර්තා ගොනු නොකරන සමිතිවලට නාමය කපා හරින බව දැනුම් දීමේ ලිපි යැවීම.
- සමිති වලට අදාළව ලැබෙන විවිධ ලිපිවලට අදාළව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම හා පිළිතුරු ලිපි යොමු කිරීම.

කාරණය	2024	2025
ලියාපදිංචි කර ඇති සමිති සංඛ්‍යාව	39	54
නාමය කපා හැර ඇති සමිති සංඛ්‍යාව	634	1173
නාමය කපා හරින බව දැනුම් දීමේ ලිපි යවා ඇති සමිති සංඛ්‍යාව	7102	7217




vi. **<u>සමාගම් ලේකම්වරු සහ විගණකවරු(ගණන් පරීක්ෂකවරු) ලියාපදිංචි කිරීමේ අංශය</u>**

2023 සමාගම් ලේකම්වරයන් පිළිබඳ නියෝග යටතේ අදාළ සුදුසුකම් සපුරා ඉල්ලුම් කරන අයදුම්කරුවන් සමාගම් ලේකම්වරයෙකු ලෙස ලියාපදිංචි කිරීම සහ 1964 සමාගම් ගණන් පරීක්ෂක නියෝග යටතේ අදාළ සුදුසුකම් සපුරා ඉල්ලුම් කරන අයදුම්කරුවන් ගණන් පරීක්ෂක ලෙස ලියාපදිංචි කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි. 2025.12.31 දිනට සමාගම් ලේකම්වරු 801 දෙනකු හා ගණන් පරීක්ෂකවරු 115 දෙනෙකු ලියාපදිංචි කිරීම සිදු කර ඇත.

<u>විගණකවරුන් සහ සමාගම් ලේකම්වරුන් ලියාපදිංචි කිරීම</u>


වර්ෂය	විගණකවරු	සමාගම් ලේකම්වරු
2019	11	264
2020	315	641
2021	359	779
2022	388	1026
2023	445	2832
2024	442	1394
2025	115	801




vii. **<u>පොදු කොන්ත්‍රාත් (ටෙන්ඩර්)අංශය</u>**

1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත යටතේ රුපියල් මිලියන 05 ට වැඩි කොන්ත්‍රාත් සඳහා ලැබෙන අයදුම්පත් පරීක්ෂා කොට ටෙන්ඩර්කරුවෙකු වෙනුවෙන් හෝ අනුනියෝජිතයෙකු, උප අනු නියෝජිතයෙකු, නියෝජිතයෙකු හෝ නාමිකයෙකු වශයෙන් ලියාපදිංචි කිරීම, අළුත් කිරීම සහ පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත යටතේ කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීම, අළුත් කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

වර්ෂය	ප්‍රමාණය	ආදායම(රු.)
2019	23,962	41,895,000.00
2020	19,233	44,608,336.00
2021	22,445	50,344,000.00
2022	13,216	29,066,000.00
2023	22,632	49,894,000.00
2024	27,689	62,760,000.00
2025	42,420	84,840,000.00





viii. **ලේඛනාගාරය සහ විමර්ශන ශාලාව**

සමාගම් සහ සමිතිවලට අදාල භෞතික ගොනු සුරක්ෂිතව තබා ගැනීමත් අවශ්‍ය අවස්ථාවන්හිදී නිලධාරීන් වෙත සහ සුපරීක්ෂණය යටතේ මහජනතාවට පරීක්ෂාකර බැලීමට නිකුත් කිරීමත්, නැවත නිසිපරිදි එම ගොනු භාර ගැනීමත් ලේඛනාගාරය මගින් සිදු කරයි. ගාස්තු ගෙවීමෙන් පසු දෙපාර්තමේන්තු අධීක්ෂණය යටතේ, සමාගම් ගොනු හා සමිති ගොනු භෞතිකව පරීක්ෂා කර බැලීම සඳහා මහජනතාවට විමර්ශන ශාලාව තුළ ඉඩකඩ සලසා ඇත. දෛනිකව ලේඛනාගාරය තුළ ඇති ගොනු සංඛ්‍යාවද ක්‍රමයෙන් වර්ධනය වන බැවින් දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලිය පරිගණකගත කිරීමේ අවශ්‍යතාවය ලේඛනාගාරයට සුවිශේෂී වේ.

ix. **සමාගම් පරීක්ෂක අංශය**

මෙම අංශයේ කාර්යයන් සඳහා සමාගම් පරීක්ෂක නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන් අනුයුක්ත කර ඇති අතර එම අංශයේ කාර්යයන් පහත පරිදි වේ.

- 2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්තිවලට පටහැනිව ක්‍රියා කරන සමාගම්වලට හා අධ්‍යක්ෂවරුන්ට එරෙහිව නඩු පැවරීමේදී නඩු ගොනු සකස් කිරීම සහ එසේ පවරන නඩුවලට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම.
- සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙනුවෙන් ඔහුගේ නියෝජිතයෙකු ලෙස නඩු සඳහා අධිකරණවල පෙනී සිටීම සහ සාක්ෂි ලබා දීම.
- සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ නියෝග මත සමාගම් වෙත ගොස් ලේඛන පරීක්ෂා කිරීම හා ස්ථානීය පරීක්ෂාවන් සිදු කිරීම.
- සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ නියෝග මත පොලිසිය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වැනි රජයේ ආයතන සඳහා අවශ්‍ය තොරතුරු, ලිපිලේඛන සහ ප්‍රකාශ ලබා දීම.
- සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් පාර්ශවකරුවකු කරන ලද නඩු කටයුතුවල පෙත්සම් සඳහා නිරීක්ෂණ වාර්තා සකස් කිරීම.
- මහජනතාව සඳහා අවශ්‍ය තොරතුරු හා ලිපිලේඛන ලබාදීම.

x. **ආයතන අංශය**

දෙපාර්තමේන්තුවේ පරිපාලනමය කටයුතු ක්‍රමවත්ව සහ නිසි පරිදි කරගෙන යාම මෙම අංශය මගින් සිදු කරන අතර එහි අධීක්ෂණ කටයුතු සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්(පාලන) විසින් සිදු කරයි.

ආයතන අංශය යටතේ තැපැල් අංශය හා ප්‍රවාහන අංශය ක්‍රියාත්මක වේ. තැපැල් අංශය මඟින් දෙපාර්තමේන්තුවට ලැබෙන ලිපි ලේඛන භාර ගැනීම අදාල අංශ වෙත යොමු කිරීම සහ දෙපාර්තමේන්තුවෙන් පිටතට යවනු ලබන ලිපි ලේඛන සම්බන්ධයෙන් කටයුතු කිරීම සිදු කරනු ලබයි. ප්‍රවාහන අංශය සතුව මෝටර් රථ 03ක්, කැබ් රථයක් හා ත්‍රීරෝද රථයක් පවතින අතර ඒ සඳහා රියදුරු මහතුන් තිදෙනෙකු අනුයුක්තව සේවය කරනු ලබයි.

xi. **ගිණුම් අංශය**

දෙපාර්තමේන්තුවේ මූල්‍ය කටයුතු හා ගිණුම් පවත්වාගෙන යාම මෙම අංශය මගින් සිදුකරනු ලබන අතර එය ප්‍රධාන ගණකාධිකාරිගේ අධීක්ෂණය යටතේ සිදුකරනු ලබයි.

xii. **අභ්‍යන්තර විගණන අංශය**

අභ්‍යන්තර පාලන ක්‍රම විධිමත් කර ගැනීමට අදාළව විගණන කටයුතු කරගෙන යාම සඳහා 2016 වර්ෂයේදී දෙපාර්තමේන්තුව තුළ මෙම අංශය ස්ථාපිත කර ඇති අතර පළමුවන ශ්‍රේණියේ ගණකාධිකාරීවරයෙකුගේ අධීක්ෂණය යටතේ එහි කටයුතු සිදුකරනු ලබයි.
මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයන් පහත පරිදි දැක්විය හැකිය.

- සමාගම් අරමුදලේ අභ්‍යන්තර විගණන කටයුතු.
- ගිණුම්කරණ ක්‍රියාවලියේ ප්‍රමාණවත් බව, නිවැරදි බව, යාවත්කාලීන බව හා කාර්යක්ෂමභාවය තහවුරු කර ගැනීම.
- ආයතන අංශයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම.
- ගිණුම් අංශයේ හා සරප් අංශයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම.
- සමාගම් අංශ වල කටයුතු අධීක්ෂණය හා අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම.
- e – ROC ව්‍යාපෘතිය සම්බන්ධ විගණන කටයුතු
- 2007 අංක 07 දරණ සමාගම් පනත, පොදු කොන්ත්‍රාත් පනත, 1935 අංක 61 දරණ සීට්ටු ආඥා පනත, සමීති ආඥා පනතට අදාළව එම අංශ ආවරණය වන පරිදි අභ්‍යන්තර සෝදිසි විගණන කටයුතු සිදු කිරීම.
- දෙපාර්තමේන්තුවේ කළමනාකරණ විගණන කමිටු රැස්වීම් පැවැත්වීම හා වාර්තා සකස් කිරීම.

xiii. **තොරතුරු තාක්ෂණ අංශය සහ පාරිභෝගික සේවා අංශය**

e - ROC පද්ධතිය තුලින් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් පාරිභෝගිකයින් වෙත ලබා දීම සඳහා දෙපාර්තමේන්තුවට අවශ්‍ය තාක්ෂණික පහසුකම් සැලසීම සහ අනෙකුත් තොරතුරු තාක්ෂණ සේවාවන් කාර්යක්ෂම හා ඵලදායී ලෙස සැපයීම මෙම අංශයේ අරමුණ වන අතර මෙම අංශයට අයත් කාර්යයන් පහත පරිදි වේ.

- e - ROC පද්ධතිය තුලින් සේවාලාභීන් සඳහා ඵලදායි හා කාර්යක්ෂම සේවාවක් ලබාදීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සැලසුම් හා ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීම.
- මෙතෙක් පවතින පද්ධති, ක්‍රමවේදයන් තුළ දී දක්නට ලැබුණු ප්‍රයෝගික දුර්වලතාවයන් හඳුනා ගෙන ඒවාට මෘදුකාංග නිර්මාණය, පරීක්ෂණය, ස්ථාපනය සහ නඩත්තු කටයුතු කිරීම.
- සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම, යාවත්කාලීන කිරීම සහ පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

- ආයතනය තුල පරිගණක ජාල නිර්මාණය, කළමනාකරණය සහ ඒවායේ නඩත්තු කටයුතු සිදු කිරීම.
- දෙපාර්තමේන්තුව තුළ ඇති සියලුම පරිගණක හා ඒ හා සම්බන්ධ උපාංග කළමනාකරණය සහ නඩත්තු කටයුතු කිරීම.
- දත්ත සුරක්ෂිභාවය උදෙසා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම.
- e - mail පද්ධතිය කාර්යක්ෂම කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

1.7 සමාගම් අරමුදල

2007 අංක 07 දරණ සමාගම් පනතේ 479 වැනි වගන්තිය යටතේ සමාගම් අරමුදල පිහිටුවා ඇත. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ එකඟත්වය මත, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නියම කරනු ලබන ආකාරයට මෙම අරමුදල පවත්වා ගෙන යනු ලැබේ. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් මෙම පනත යටතේ නියම කරනු ලබන, පනවනු ලබන හෝ අය කරනු ලබන සෑම ගාස්තුවකින්ම හෝ අයකිරීමකින්ම තුනෙන් දෙකොටසක් (2/3) සමාගම් අරමුදලට ගෙවනු ලැබිය යුතුය. මෙම පනත යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍යාංශ ලේකම්වරයාගේ එකඟතාවය මත සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් දරනු ලබන යම් වියදමක් පියවීම සඳහා නියමිත සියළු මුදල් මෙකී අරමුදලින් ගෙවිය හැකිය.

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ

- සමාගම් ලේකම්වරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

- e-ROC පද්ධතියේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදුකරනු ලැබූ පෞද්ගලික පාර්ශවයෙන් දෙපාර්තමේන්තුව වෙත එම මෙහෙයුම් හා නඩත්තු කටයුතුවල පරිපාලනමය අයිතිය පවරා ගැනීම 2025.07.22 දින සිදුවූ අතර එය මෙම වර්ෂය තුළ දෙපාර්තමේන්තුවෙහි විශේෂ ජයග්‍රහණයකි.

- 2007 අංක 7 දරන සමාගම් පනත සඳහා අර්ථලාභී හිමිකාරීත්වය සම්බන්ධව ප්‍රතිපාදන ඇතුළත් කරමින් 2025 අංක 12 දරන සමාගම්(සංශෝධන) පනත හඳුන්වාදීම.

- 2025 අංක 12 දරන සමාගම් (සංශෝධන) පනත මඟින් හඳුන්වාදුන් නව ප්‍රතිපාදන සම්බන්ධව සමාගම් හා සමාගම් ලේකම්වරුන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු මාලාවක් පැවැත්වීම හා ඒ සඳහා සම්පත් දායකත්වය ලබා දීම.

- 2025 අංක 12 දරන සමාගම් (සංශෝධන) පනතට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය සඳහා දිරි දීමනාවක් ලබා දීමට අදාළ කරුණු ඇතුළත් කිරීම.

- කොටස් වෙළඳපොල තුළ ආයෝජනය කිරීම සඳහා මෙරට ලියාපදිංචි සමාගම් දැනුවත් කිරීමට හා පෙළඹවීමට කොටස් වෙළඳපොළ හා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සමඟ සමාගම් සම්බන්ධ කරමින් වැඩමුළුවක් පැවැත්වීම.

- මෙම දෙපාර්තමේන්තුවේ දිගු කාලයක් පුරප්පාඩුව පැවති සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්, නීති නිලධාරී, සමාගම් පරීක්ෂක නිලධාරී හා ගොඩනැගිලි ඕවර්සියර් යන තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට රාජ්‍ය සේවයේ බඳවාගැනීම් සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුව විසින් අනුමැතිය ලබා දීම. ඒ අනුව දෙපාර්තමේන්තුගත කාර්ය මණ්ඩල පුරප්පාඩු කිහිපයක් සම්පූර්ණ කර ගැනීමට හැකි වනු ඇත.

2.2 <u>අභියෝග</u>

- දැනට සමාගම් 250,000 කට වඩා අධික ප්‍රමාණයක් සංස්ථාපනය වී ඇත. දෛනිකව ද මෙම සංඛ්‍යාව ඉහල ගියද ඊට සාපේක්ෂව සියළු මට්ටම්වල නිලධාරීන් වැඩිවීමක් සිදු නොවන බැවින්, මෙම ඉල්ලුමට සරිලන ප්‍රමාණාත්මක හා වඩාත් ගුණාත්මක සේවාවක් ලබා දීම සඳහා අනුමත නිලධාරීන්ගේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම හා අනුමත කාර්ය මණ්ඩලය වැඩි කර ගැනීම අත්‍යාවශ්‍ය වේ. නමුත් සමාගම් අංශවල ලේඛන ලියාපදිංචි කිරීමේ කටයුතුවල වැඩි වශයෙන් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ හා සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන් නිරතව සිටින අතර එම තනතුරුවල පවතින පුරප්පාඩු හේතුවෙන් රාජකාරී කටයුතුවල යම් ප්‍රමාදයන් සිදු විය හැකි අතර එමඟින් සේවාලාභීන් අපහසුතාවයට පත්වේ. එය වැලැක්වීම සඳහා කාර්ය මණ්ඩලය කළමනාකරණය කර ගනිමින් සියළු කටයුතු අප්‍රමාදව සිදු කිරීම අභියෝගාත්මක වේ. එසේම දෙපාර්තමේන්තුගත විධායක සේවයේ නිලධාරීන් සංඛ්‍යාව ද පවතින කාර්යයන්ට සාපේක්ෂව අඩු වීම නිසා එම නිලධාරීන්ට පැවරෙන කටයුතු සියල්ල මනාව කළමනාකරණය කර ගනිමින් කාර්යක්ෂම සේවාවක් සැපයීම ද අභියෝගාත්මක වේ.

- මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් යෙදවීම වැලැක්වීම පිළිබඳව (Anti-Money Laundering & Combating the Financial Terrorism) දෙපාර්තමේන්තුව සතුව ඒ නමින් අංශයක් පිහිටුවා, එහි කර්තව්‍යන් සිදු කිරීම සඳහා පූර්ණ කාලීනව නිලධාරීන් බඳවා ගැනීමටත් එම අංශය සඳහා ඉඩකඩ සකස් කරගැනීමටත් කටයුතු කරමින් පවතින අතර මේ වන විට වෙනත් අංශවල නිලධාරීන් වැඩ බැලීමේ පදනමින් මෙම අංශයේ රාජකාරී කටයුතු ද සඳහාද යොදවා ඇත. නමුත් මෙම දෙපාර්තමේන්තුවේ පවතින කාර්යමණ්ඩල පුරප්පාඩු හේතුවෙන් මෙසේ තවත් අංශයක රාජකාරී සඳහා නිලධාරීන් යෙදවීම අපහසුතාවයකි.

- e -ROC ව්‍යාපෘතිය අඛණ්ඩව යාවත්කාලීන කරමින් පවත්වාගත යුතුය. එහිදී අවශ්‍ය වන උපාංග හා සේවාවන් කඩිනමින් හා ඉහළ ප්‍රමිතියකින් යුක්තව ලබාගත යුතු අතර ඒවා ඉහළ වෙළඳපොළ වටිනාකමකින් යුක්තය. e -ROC පද්ධතිය ප්‍රශස්ථ ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය සේවාවන් ලබා ගැනීමේදී හා එය නඩත්තු කිරීමේදී එකී වියදම් දැරිය යුතු වන්නේ ද රජයේ නියමිත රෙගුලාසි හා නියමයන් අනුවය. එසේ රජයේ රෙගුලාසි හා නියමයන් අනුව කටයුතු කිරීමේදී වියදම් සීමාකිරීම් සහ ක්‍රියා කිරීමට නොවැලැක්විය හැකි යම් කාලයක් ගත වීම හේතුවෙන් ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය යුතු හා මිල අධික ඉහළ ප්‍රමිතියෙන් යුතු සේවා අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම දැවැන්ත අභියෝගයකි.

- e -ROC පද්ධතියේ නඩත්තු හා මෙහෙයුම් කටයුතු සිදු කරනු ලැබූ පෞද්ගලික ආයතනයෙන් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත පද්ධතිය පවරා ගැනීමත් සමඟ එම පද්ධතියේ කටයුතු සම්බන්ධව අවශ්‍ය දැනුම සහිත නිලධාරීන් දෙපාර්තමේන්තුව තුළ නොමැති වීම හා සිටින නිලධාරීන්ට අදාළ ක්ෂේත්‍රයන් සම්බන්ධව පුහුණුවීම් ලබා දෙමින් හා වෙනත් ආයතනවල නිලධාරීන්ගේ සහාය ලබා ගනිමින් සිදු කරගෙන යාම ද දෙපාර්තමේන්තුව මුහුණ දෙන අභියෝගයකි.

➢ රජයේ ප්‍රතිපත්ති හා තීරණ අනුව e -ROC පද්ධතිය සමග අනෙකුත් රාජ්‍ය ආයතන ඒකාබද්ධ කිරීම සඳහා කටයුතු කිරීමේදී එම ආයතන මුහුණ දෙන තාක්ෂණික ගැටලු ඇතුලු කරුණු කාරණා හේතුවෙන් එම කාර්යය අභියෝගාත්මක වීම.

2.3 ඉදිරි ඉලක්කයන්

❖ e -ROC පද්ධතිය සඳහා වැඩිදියුණු කිරීම් කිහිපයක් හඳුන්වාදීමට නියමිතය.

- අර්ථලාභී හිමිකාරිත්ව රෙජිස්ටරය සකස් කිරීම,
- වරාය නගර සමාගම් ලියාපදිංචිය සඳහා මොඩියුලය සකස් කිරීම,
- සමාගම් ලේකම්වරුන් සඳහා වන මොඩියුලය සකස් කිරීම,
- වෙනත් ජාතික තලයේ පද්ධති සමඟ e ROC පද්ධතිය ඒකාබද්ධ කිරීම

❖ e -ROC Version 2 හඳුන්වාදීම.

පවතින e -ROC පද්ධතියට වඩා යාවත්කාලීන හා පහසුකම් සහිතව 2026 වර්ෂයේදී e-ROC Version 2 සංවර්ධනය කර හඳුන්වාදීමට නියමිතය.

❖ **දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පැවති තනතුරු කිහිපයක් සඳහා නව බඳවාගැනීම් සිදු කිරීම.**

මෙම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පැවති සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්, නීති නිලධාරී, සමාගම් පරීක්ෂක නිලධාරී, ගොඩනැගිලි ඕවර්සියර් යන තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට රාජ්‍ය සේවයේ බඳවාගැනීම් සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද නිලධාරී කමිටුව විසින් අනුමැතිය ලබා දුන් බැවින් 2026 වර්ෂය තුළ එම බඳවාගැනීම් සිදුකර පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අපේක්ෂා කෙරේ.

❖ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම.

❖ සමාගම් ලියාපදිංචි කිරීම සඳහා එක්දින සේවාවක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

❖ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය සඳහා දිරි දීමනාවක් ලබා දීම 2026 වර්ෂයේ සිට ආරම්භ කිරීමට අපේක්ෂිතය.

❖ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීම සඳහා හවුල්කාරිත්ව ක්‍රමවේදයක් සකස් කිරීමට සැලසුම් කෙරේ.

❖ කෘෂි ආර්ථිකයක් බිහි කිරීමට අවශ්‍ය පරිදි කෘෂි නිෂ්පාදකයින් සඳහා ව්‍යාපාර/ සමාගම් ආරම්භ කර ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කිරීම.

❖ ආයෝජකයින් හට ආකර්ශනීය සේවාවක් ලබා දී ඉහළ වෙළඳ ප්‍රජාවක් බිහිකර එමඟින් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ අවසාන ඉලක්කයයි.

කේ.ඒ.පී. ද සිල්වා
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (වැ.බ.)

කේ. ඒ. පී. ද සිල්වා
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (වැ.බ)
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක 400, බී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025		සටහන	තක්ෂ 2025	2024	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එෆ්සිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
503,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	606,166,133	494,826,934	
503,000,000	මුළු ආදායම් ලැබීම් (අ)		606,166,133	494,826,934	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		105,037,000	82,522,721	එෆ්සිඒ-3
-	තැන්පතු		48,190	38,025	එෆ්සිඒ-4
6,000,000	අත්තිකාරම් ගිණුම්		9,849,218	11,330,601	එෆ්සිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
6,000,000	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		114,934,408	93,891,347	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		721,100,541	588,718,281	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		352,377,175	290,185,691	
	භාණ්ඩාගාරය විසින් අත්තිකාරම් පියවීම		260,498,358	216,116,003	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		108,225,009	82,416,587	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
104,800,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	102,001,317	89,689,981	
5,800,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	5,097,781	-	එෆ්සිඒ-2(ii)
380,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	354,573	393,462	
-	පොළී ගෙවීම්	8	-	-	
27,935	වෙනත් පුනරාවර්තන වියදම්	9	27,935	-	
111,007,935	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		107,481,606	90,083,443	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	-	-	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එෆ්සිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
-	හැකියා වර්ධනය	14	-	-	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
-	මුළු මූලධන වියදම් (උ)		-	-	
	තැන්පතු ගෙවීම්		46,390	38,025	එෆ්සිඒ-4
8,000,000	අත්තිකාරම් ගෙවීම්		10,021,940	10,978,355	එෆ්සිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		10,068,330	11,016,380	
8,000,000	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		117,549,936	101,099,823	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(9,324,927)	(18,683,236)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(9,324,927)	(18,683,236)	එෆ්සිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-		එෆ්සිඒ-3
			-	-	

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තක්‍ය 2,025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	-	-
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	21,749,126	21,928,650
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	1,800	-
මුළු වත්කම්		21,750,926	21,928,650
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		21,749,126	21,928,650
දේපළ පිරියත හා උපකරණ සංචිතය		-	-
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	1,800	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		21,750,926	21,928,650

පිටු අංක 07 සිට 30 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 31 සිට 38 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2026-02-27	දිනය :	දිනය : 2026-02-26
කේ.ඒ. විමලේන්තිරරාජා ලේකම් වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය අංක 491, ආර්.ඒ. ද මැල් මාවත, බී 03.	කේ. ඒ. පේ. දයාසිල්වා සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (වැ.බ) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව "සමාගම් මැදුර" අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.	ඩී. ඒ. ආර්. එන්. මාලසූරිය ප්‍රධාන ගණකාධිකාරි සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව "සමාගම් මැදුර" අංක: 400, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ - 10.

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

තක්ෂ

	2025 රු.	සංශෝධිත 2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	606,166,133	494,826,934
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
ආදායම් නොවන ලැබීම් **	-	1,200,000
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	11,961,622	18,683,923
අග්‍රිම ලැබීම්	105,037,000	82,522,721
අත්තිකාරම් අයකර ගැනීම්	5,975,671	6,170,891
කැන්පතු ලැබීම්	48,190	38,025
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	729,188,616	603,442,494
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	107,099,098	89,689,981
සහනාධාර සහ මාරුකිරීම්	354,573	393,463
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් :	821,307	322,721
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	352,377,175	506,301,694
භාණ්ඩාගාරයට දෙන ලද අත්තිකාරම් අය කර ගැනීම	260,498,358	
අත්තිකාරම් ගෙවීම්	7,991,716	6,696,610
කැන්පතු ගෙවීම්	46,390	38,024
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	729,188,616	603,442,494
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	-	-
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

ආදායම් ගණන් දීමේ නිලධාරි : සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්

වියදම් ශීර්ෂ අංකය : 297

රු.

ආදායම් සංකේතය	ආදායම් විස්තරය	සටහන	ආදායම් ඇස්තමේන්තුව (1)		ආදායම් රැස්කිරීම් (2)			(3)	ආදායමෙන් ආපසු ගෙවීම් (4)			(5)
			මූලික ඇස්තමේන්තුව	සංශෝධිත ඇස්තමේන්තුව	අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම්	වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම් (SA-21-1)	එකතුව	හිඟ ආදායම් රැස්කිරීම්	මුදලින්	වැරදි නිවැරදි කිරීම්	එකතුව	ශුද්ධ ආදායම
			1(i)	1(ii)	2(i)	2(ii)	2(iii)=2(i)+2(ii)	(3)	4(i)	4(ii)	4(iii)=4(i)+4(ii)	5=2(iii)+(3)-4(iii)
2003.02.10	සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු		370,000,000.00	440,000,000.00	521,456,133.00	-	521,456,133.00	-	-	-	-	521,456,133.00
2003.02.12	රාජ්‍ය කොන්ත්‍රාත් පනත යටතේ අයකරනු ලබන ගාස්තු		54,000,000.00	63,000,000.00	84,710,000.00	-	84,710,000.00	-	-	-	-	84,710,000.00
	අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලද ආදායම (ආ)		424,000,000.00	503,000,000.00	606,166,133.00	-	606,166,133.00	-	-	-	-	606,166,133.00
	මුළු බදු නොවන ආදායම (අ) + (ආ)		424,000,000.00	503,000,000.00	606,166,133.00	-	606,166,133.00	-	-	-	-	606,166,133.00
	මුළු ආදායම (සටහන් 1 - 4)		424,000,000.00	503,000,000.00	606,166,133.00	-	606,166,133.00	-	-	-	-	606,166,133.00

2026-02-26
දිනය

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි /මුදල් අංශයේ ප්‍රධානි නම සහ අත්සන

.....
ආදායම් ගණන්දීමේ නිලධාරි නම, තනතුර සහ අත්සන

* තමන්ට අදාළ ආදායම් සංකේතය පමණක් ඇතුළත් වන පරිදි ආකෘති පත්‍රය සංශෝධනය කර ගත යුතු ය.

ඩී. ඒ. ආර්. එන්. බාලසූරිය
ප්‍රධාන ගණකාධිකාරි
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක: 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ - 10.

කේ. ඒ. පී. ද සිල්වා
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (වැ.බ)
රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

ඒඝිඒ - 1(i)

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

ආදායම් ගණන් දීමේ නිලධාරි : සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්

වියදම් ශීර්ෂ අංකය : 297

පූර්ව මුදල් වර්ෂ 3 සඳහා ශුද්ධ ආදායම් රැස්කිරීම	වර්ෂය 1 (2022)	රු. 4,533,300.00
	වර්ෂය 2 (2023)	රු. 12,564,900.00
	වර්ෂය 3 (2024)	රු. 27,675,900.00

රු.

කාල පරිච්ඡේදය	ආදායම් සංකේතය	ආදායම් විස්තරය	වර්ෂ ආරම්භක ශේෂය (1)	වාර්තා කරනු ලබන වර්ෂයට අදාළ හිඟ මුදල් (2)	අයකර ගැනීම් (3)	කපා හරින ලද හිඟ ආදායම් (4)	වර්ෂ අවසාන ශේෂය 5=(1)+(2)-[(3)+(4)]
(1) වාර්තා කරනු ලබන වසරට අදාළ හිඟ මුදල්	2003.02.10	සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු					-
උප එකතුව							-
(2) පසුගිය වසරට අදාළ හිඟ මුදල්	2003.02.10	සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු					274,378,500.00
උප එකතුව							274,378,500.00
(3) පසුගිය වසරට පෙර වසර වනවිට හිඟ මුදල්	2003.02.10	සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු					1,505,731,800.00
උප එකතුව							1,505,731,800.00
එකතුව							1,780,110,300.00

2026-02-26
දිනය

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි /මුදල් අංශයේ ප්‍රධානි නම සහ අත්සන

ඩී. ඒ. ආර්. එන්. බාලසූරිය
ප්‍රධාන ගණකාධිකාරි
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක: 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ - 10.

.....
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ අත්සන
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ නම:
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ තනතුර:

කේ. ඒ. පී. ද සිල්වා
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (වැ.බ)
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

වැඩසටහන් අනුව වියදම් මූල්‍යකරණ සාරාංශය

දෙපාර්තමේන්තුවේ නම : සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය : 297

	මූල්‍යකරණය	වැඩසටහන 01*		වැඩසටහන 02*		මුළු එකතුව		
සංකේතය	සංකේත විස්තරය	ශුද්ධ ප්‍රතිපාදනය **	සත්‍ය වියදම	ශුද්ධ ප්‍රතිපාදනය **	සත්‍ය වියදම	ශුද්ධ ප්‍රතිපාදනය **	සත්‍ය වියදම	වියදමේ ප්‍රතිශතය ***
		1	2	3	4	5	6	(6÷5)X100
		රු.	රු.	රු.	රු.	රු.	රු.	%
11	දේශීය අරමුදල්	111,000,000.00	107,481,605.61	-	-	111,000,000.00	107,481,605.61	97
12	විදේශ ණය							
13	විදේශ ප්‍රදාන							
14	ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය							
15	ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන							
16	ප්‍රතිපාර්ශවීය අරමුදල්							
17	විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය							
18	විදේශීය මූල්‍යයනය ආශ්‍රිත දේශීය සම මූල්‍යනය							
21	විශේෂ නීති සේවා							
	එකතුව	111,000,000	107,481,605.61	-	-	111,000,000.00	107,481,605.61	97

* ඒඕඒ- 2 (v) අනුව එක් එක් වැඩසටහන් යටතේ ඇති අගයන් ඇතුළත් කරන්න

** ඒඕඒ- 2 හි 4 වන තීරුවට යොමුගත ප්‍රතිපාදන

*** දශමස්ථාන රහිතව % සඳහන් කරන්න

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2026-02-26

ඩී. ඒ. ආර්. එන්. බාලසූරිය
ප්‍රධාන ගණකාධිකාරී
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක: 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ - 10.

2025 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

දෙපාර්තමේන්තුවේ නම : සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය : 297

රු.

අග්‍රිම ගිණුම් අංකය	2025 ජනවාරි 01 දිනට අග්‍රිම ශේෂය 1			අග්‍රිම ලැබීම් 2			අග්‍රිම පියවීම් 3			2025 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය 4			2025 දෙසැම්බර් 31 දිනට ආයතන පොත් අනුව ශේෂය	2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය
	නොපිය වූ උප අග්‍රිම	නොපිය වූ අග්‍රිම (නොපියවූ උප අග්‍රිම හැර)	එකතුව	භාණ්ඩාගාරයෙන්	වෙනත් මූලාශ්‍රවලින්	එකතුව	වියදම් මගින්	මූදල් මගින්	එකතුව	නොපිය වූ උප අග්‍රිම ශේෂය	නොපිය වූ අග්‍රිම ශේෂය	එකතුව	*5	6
	1(i)	1(ii)	1(iii)	2(i)	2(ii)	2(iii)=2(i)+2(ii)	3(i)	3(ii)	3(iii)=3(i)+3(ii)	4(i)	4(ii)	4(iii)=4(i)+4(ii)	5=1(iii)+2(iii)-3(iii)	
7002-0-0-125-0-25-0	-	-	-	105,037,000.00	629,980,346.03	735,017,346.03	382,640,171.39	352,377,174.64	735,017,346.03	-	-	-	-	6,709,399.20

1. ඉහත 4 හා 6 ශේෂ අතර වෙනසට හේතු පෙන්වන්න

(1) ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2025.12.31 දිනට මූදල් ශේෂය	6,709,399.20
(2) වෙනත් හේතු -	-
	6,709,399.20

මෙම ශේෂ වාර්තාව අත්සන් කරන දින වන විට පියවා ඇත්නම් ඒ බව ද, නොඑසේ නම් නොපියවීමට හේතු සඳහන් කරන්න.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූදල්) /කොමසාරිස් (මූදල්)
දිනය : 2026-02-26

ඩී. ඒ. ආර්. එන්. බාලසූරිය
ප්‍රධාන ගණකාධිකාරි
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක: 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ - 10.

* මෙම ශේෂය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි පෙන්විය යුතු ය.

2025 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 297

දෙපාර්තමේන්තුවේ නම : සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

රු.

අත්තිකාරම් ගිණුමේ නම	අත්තිකාරම් ගිණුම් අංකය	2025 ජනවාරි 01 දිනට ශේෂය (1)	වියදමෙහි උපරිම සීමා රු. 8,000,000		ලැබීම්වල අවම සීමා රු. 6,000,000		හර ශේෂයන්ගේ උපරිම සීමා රු. 35,000,000	බැරකම් පිළිබඳ උපරිම සීමා රු.	2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය
			වර්ෂය තුළ හර කිරීම් (2)		වර්ෂය තුළ බැර කිරීම් (3)		ශේෂය 4=(1)+(2)-(3)		
			මුදලින්	හරස් සටහන් මඟින්	මුදලින්	හරස් සටහන් මඟින්			
(1) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම්	8493-0-0-297	21,576,404.00	7,991,716.00	2,030,224.00	5,975,671.14	3,873,547.00	21,749,125.86		21,749,125.86

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2026-02-26

ඩී. ඒ. ආර්. එන්. බාලසූරිය
ප්‍රධාන ගණකාධිකාරි
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක: 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ - 10.

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2025.12.31 දිනට තත්ත්ව වාර්තාව

වියදම් ශීර්ෂ අංකය: 297 දෙපාර්තමේන්තුවේ නම : සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2025.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.)	2025.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.)	2025.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්)	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
1	මහජන බැංකුව	143-100199027300	7,110,144.83	-	31,460.00	2025 දෙසැම්බර්
2	මහජන බැංකුව	143-100109026060	-	-	-	2025 දෙසැම්බර්

ඉහත සඳහන් කොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2026-02-26

ඩී. ඒ. ආර්. එන්. බාලසූරිය
ප්‍රධාන ගණකාධිකාරි
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක: 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ - 10.

2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද සමාගම් අරමුදල

2025.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන්	2025.12.31	2024.12.31 - නැවත ස්ථාපිත ශේෂය
		රු.	රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන විෂයයන්	11	147,308,768	156,870,509
ලැබිය යුතු ආදායම්	12	9,243,908	16,758,513
ලිපිද්‍රව්‍ය තොගය	13	2,807,637	3,727,487
ඉදිරියට කල ගෙවීම්	14	347,887	699,650
ආරක්ෂක සේවා ඇප තැන්පත්		25,000	25,000
ලැබිය යුතු භාණ්ඩාගාර බැඳුම්කර පොළිය	15	138,651,227	112,891,505
හා.නි.ලේ. ගෙන් හිලව් කල යුතු මුදල	16	1,059,396	2,107,933
අත්තිකාරම්		183,783	138,600
		299,627,605	293,219,197
ජංගම නොවන වත්කම්			
කොටස් ආයෝජන		90,275,000	90,275,000
දේපළ පිරියත හා උපකරණ	17	1,093,755,029	1,093,881,138
අස්පෘශ්‍ය වත්කම්	18	33,957,035	37,730,039
හා.නි.ලේ. අත්තිකාරම්	19	4,112,119,593	4,371,569,414
ආයෝජන -භාණ්ඩාගාර බැඳුම්කර	20	5,917,402,418	4,257,007,795
ආයෝජන -භාණ්ඩාගාර බැඳුම්කර (ඇවර)	21	43,179,986	23,830,411
		11,290,689,061	9,874,293,797
මුළු වත්කම්		11,590,316,666	10,167,512,994
වගකීම්			
ජංගම වගකීම්			
හා.නි.ලේ. ගෙවිය යුතු මුදල	22	2,122,242	4,226,215
දේ.ආ.කොා. ගෙවිය යුතු වැට්	23	1,168,169	2,337,830
ගෙවිය යුතු පොළිය - ඇවර කිරීම්	24	48,075,273	40,631,757
උපචිත වියදම්	25	30,541,796	21,029,568
පොදු තැන්පත් ගිණුම්	26	248,753	149,470
ඇවරකරුවන්ගේ තැන්පතු	27	111,196,537	85,253,728
		193,352,770	153,628,568
ජංගම නොවන වගකීම්			
මුළු වගකීම්		193,352,770	153,628,568
ශුද්ධ වත්කම්		**11,396,963,897**	**10,013,884,426**
ශුද්ධ වත්කම්/ස්කන්ධය			
ප්‍රත්‍යාගණන සංචිතය		699,662,016	699,662,016
සමුච්චිත අතිරික්තය / ඌනතාවය		10,697,301,880	9,314,222,409
මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය		**11,396,963,897**	**10,013,884,426**

බී.ඒ.ආර්.එන්.බාලසූරිය
ප්‍රධාන ගණකාධිකාරී

කේ.ඒ.පී.ද සිල්වා
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (වැ.බ)
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක 400, වී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

2007 අංක 07 දරණ සමාගම් පනතේ 479 (5) වගන්තිය අනුව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම් හා ඉදිරිපත් කිරීමේ වගකීම් වෙළඳ,වාණිජ,ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශනය 2026.02.26 දින අනුමත කරන ලදී.

කේ.ඒ. විමලේන්තිරරාජා
ලේකම්
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ
සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

සමාගම අරමුදල - **2025.12.31** දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

		2025	2024	2023
		රු.	රු	රු.
අයභාරය	සටහන්			
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ලැබීම්	1	**1,037,873,183.94**	**867,254,789.28**	**733,421,344.79**
වෙනත් අයභාර		**722,842,151.63**	**483,663,417.92**	**282,191,592.95**
භාණ්ඩාගාර බැඳුම්කර පොළිය	2	707,833,648.96	452,751,542.04	261,009,419.59
භාණ්ඩාගාර බිල්පත් පොළිය	3	-	17,690,938.82	8,056,191.74
ගොඩනැඟිලි කුලිය	4	14,807,419.35	13,080,000.00	13,080,000.00
වෙනත් ආදායම්	5	201,083.32	140,937.06	45,981.62
මුළු අයභාරය		**1,760,715,335.57**	**1,350,918,207.20**	**1,015,612,937.75**
වියදම්				
පුනරාවර්තන වියදම්				
වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ	6	(5,681,269.00)	(8,696,860.95)	(8,424,059.30)
සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය	7	(176,899,189.25)	(158,737,292.09)	(148,837,757.41)
ක්ෂය	8	(13,207,646.23)	(14,988,345.12)	(8,968,088.24)
වෙනත් වියදම්	9	(34,000.00)	(9,483,232.44)	(3,874.90)
ප්‍රාග්ධන වියදම්				
ආයෝජන උපලබ්ධි කිරීමේ පාඩු	10	(181,813,760.86)	(11,946,256.85)	
මුළු වියදම්		**(377,635,865.35)**	**(203,851,987.45)**	**(166,233,779.85)**
අතිරික්තය		**1,383,079,470.22**	**1,147,066,219.75**	**849,379,157.90**

සමාගම අරමුදල

මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වක්‍ර ක්‍රමය)

2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
ආදායම් වියදම් ගිණුමේ අතිරික්තය		1,383,079,470
ගැලපීම් :-		
ක්ෂයවීම්	13,207,646	
පොලී ආදායම	(707,833,649)	
පෙර වර්ෂයට කරන ලද ගැලපුම්	-	
ආයෝජන උපලබ්ධි කිරීමේ පාඩු	181,813,761	
ස්ථාවර වත්කම් විකිණීමේ අලාභ	-	
ප්‍රත්‍යාගණන අලාභය	-	
		(512,812,242)
කාරක ප්‍රාග්ධනය වෙනස් වීම්		870,267,228
තොරතුරු කළ ගෙවීම්	351,763	
හා.නි.ලේ. ගෙන් හිලව් කළ යුතු මුදල	1,048,537	
ලැබිය යුතු ආදායම්	7,514,606	
දේ.ආ.කෝ. ගෙවිය යුතු වැට්	(1,169,661)	
උපචිත වියදම්	9,512,227	
පොදු නැන්පත්	99,283	
ලිපිද්‍රව්‍ය තොගය	919,850	
අත්තිකාරම්	(45,183)	
හා.නි.ලේ. ගෙවිය යුතු මුදල	(2,103,973)	16,127,449
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		886,394,677
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
භාණ්ඩාගාර බැඳුම්කර කල් පිරීමෙන් ලද මුදල	1,350,343,000	
භාණ්ඩාගාර බැඳුම්කර/ බිල්පත්වල ආයෝජනය	(3,169,991,280)	
ස්ථාවර වත්කම් මිලදී ගැනීම්	(9,308,534)	
හා.නි.ලේ. අත්තිකාරම්	259,449,821	
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබීම්	-	
ඇවර කිරීමේ ගිණුමට ලැබීම්	25,942,810	
නැමිපත්කරුවන්ට ගෙවීම්	-	
පොලී ලැබීම්	647,607,764	
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		(895,956,418)
මුදල් හා මුදල් සමාන වත්කම් වල ශුද්ධ වැඩි වීම්		(9,561,741)
2025.01.01 දිනට මුදල් ශේෂය	156,870,509	
2025.12.31 දිනට මුදල් ශේෂය	147,308,768	
		(9,561,741)

2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වැනි වගන්තිය අනුව පහත්වන ලද සමාගම් අරමුදල්

2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම

	රු.	රු.
මුදල් පොතේ ආරම්භක ශේෂයන්		
ගිණුම් අංක 143-100153298050 හි ශේෂය		54,815,435.17
ගිණුම් අංක 143-100113298052 හි ශේෂය		102,055,073.94
එකතු කළා- ලැබීම්		
සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (මුදල්, චෙක්පත්)-143100153298050	13,447,741.32	
සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (අන්තර්ජාල- සම්පත් බැංකුව)	-	
සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (අන්තර්ජාල-තේෂන් ට්‍රස්ට් බැංකුව)	-	
සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (ලංකා බැංකුව)	1,846,855,262.00	
සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (සෘජු ලැබීම්)	-	
පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (වැට)	2,160.00	
භා.නි.ලේ. ගෙවීම් - අත්තිකාරම් බිලට් කිරීම	260,498,357.56	
මුදල් ඇණවුම් ආදායම් ලැබීම්	209,734.00	
ගොඩනැගිලි කුලිය	14,657,419.35	
ඇවර කිරීමේ ගිණුමට ලැබීම්	25,942,809.56	
භාණ්ඩාගාර බැදුම්කරවලින් ලද පොළිය (සමාගම් ඇවර කිරීමේ ගිණුම)	6,908,905.00	
භාණ්ඩාගාර බිල්පත් කල්පිරීමෙන් ලද මුදල් (සමාගම් ඇවර කිරීමේ ගිණුම	11,185,000.00	
භාණ්ඩාගාර බැදුම්කරවලින් ලද පොළිය	640,698,859.25	
භාණ්ඩාගාර බිල්පත් කල්පිරීමෙන් ලද මුදල්	-	
භාණ්ඩාගාර බැදුම්කර කල්පිරීමෙන් ලද මුදල්	1,339,158,000.00	
විවිධ තැන්පත්	176,725.00	
විවිධ ආදායම්	207,083.32	4,159,948,056.36
		4,316,818,565.47
අඩු කළා- ගෙවීම්		
අතිකාල හා නිවාඩු දින වැටුප්	1,263,943.47	
චෙනත් දීමනා	552,216.00	
ගමන් වියදම් - දේශීය	6,077.80	
ගමන් වියදම් - විදේශීය	-	
ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	1,510,482.84	
ඉන්ධන		
ඉන්ධන දීමනාව	487,080.00	
සංචිත වාහන සඳහා ඉන්ධන	1,299,669.85	
චෙනත් කටයුතු සඳහා ඉන්ධන	57,200.00	
ආහාරපාන හා නිල ඇඳුම් සැපයීම		
නිල ඇඳුම්	100,000.00	
ආහාර පාන	4,000.00	
වෛද්‍ය සැපයීම්	19,577.31	
චෙනත් (1205)	1,661,424.40	
වාහන නඩත්තු	2,494,480.66	
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ(නඩත්තු)	2,639,485.82	
ගොඩනැගිලි (නඩත්තු)	1,286,160.44	
මෘදුකාංග නඩත්තු	40,502,513.75	
ප්‍රවාහන	1,080,075.00	
කැපැල් හා සන්නිවේදන	11,434,507.76	
විදුලිය හා ජලය	15,963,035.17	
බදු කුලී සහ පළාත් පාලන ආයතන	2,871,680.40	
පිරිසිදු කිරීම් හා පවිත්‍රතා සේවා	4,831,767.31	
ආරක්ෂක සේවා	9,126,803.86	
චෙනත්(1409)		
යන්ත්‍ර හා කාර්යාල උපකරණ සේවා ගිවිසුම්	1,629,604.03	
වාහන රක්ෂණ	231,641.60	
විවිධ සේවා වියදම්	69,813,025.10	
ගොඩනැගිලි හා ඉදිකිරීම් නඩත්තු	943,450.00	
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු	362,929.95	
වාහන වැඩිදියුණු කිරීම්	-	
ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ	372,543.71	
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	7,635,360.00	
කාර්ය මණ්ඩල පුහුණු කිරීම්	706,350.00	
ප්‍රතිවර්ගීකරණය	-	
භා.නි.ලේ. ගෙවීම්-ආදායම් ශීර්ෂ 20.03.02.10	4,176,201.65	
භා.නි.ලේ. ගෙවීම්-ආදායම් ශීර්ෂ 20.03.02.10 SB	-	
භා.නි.ලේ. ගෙවීම්-ආදායම් ශීර්ෂ 20.03.02.10 NTB	-	
භා.නි.ලේ. ගෙවීම්-ආදායම් ශීර්ෂ 20.03.02.10 BOC	517,579,931.36	
බැංකු ගාස්තු	-	
අත්තිකාරම්	45,183.00	
එකතු කළ අගය මත ගෙවීම්	26,358,677.97	
එකතු කළ අගය මත ගෙවීම් -දේශීය ආදායම් කොමිසාරිස්	270,377,895.93	
භාණ්ඩාගාර බැදුම්කර ආයෝජන	3,139,991,315.56	
භාණ්ඩාගාර බැදුම්කර ආයෝජන (සමාගම් ඇවර කිරීමේ ගිණුම්)	29,999,963.95	
ඇවර කිරීමේ ගිණුමෙන් ගෙවීම්	-	
අරමුදලින් මාරුකිරීම්	-	
ආදායමෙන් ආපසු ගෙවීම්	16,100.00	
තැන්පත් ආපසු ගෙවීම්	77,442.00	4,169,509,797.64
මුදල් පොතේ අවසාන ශේෂයන්		
ගිණුම් අංක 143-100153298050 හි ශේෂය	31,216,943.26	
ගිණුම් අංක 143-100113298052 හි ශේෂය	116,091,824.55	147,308,767.81
		4,316,818,565.45

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් ශීර්ෂය	ආදායම් ක්ෙතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතය (%)
1003.07.08	සමාගම් ලියාපදිංචි කිරීමේ බද්ද				
2003.02.10	සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු	370,000	440,000	521,456	118.51%
2003.02.12	රාජ්‍ය පොදු කොන්ත්‍රාත් පනත යටතේ අයකරනු ලබන ගාස්තු	54,000	63,000	84,710	134.46%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ශීර්ෂය 297

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ක් ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	36,200	111,000	107,482	96.83%
ප්‍රාග්ධන				

සමාගම් අරමුදල

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ක් ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	268,769	243,069	170,866	70%
ප්‍රාග්ධන	208,400	103,600	10,020	10%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % වලින්
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	මැතිවරණ කොමිෂන් සභාව	ජනාධිපතිවරණ රාජකාරීවල නිරත වූ නිලධාරීන්ගේ දීමනා ගෙවීම	**398,375.00**		**398,375.00**	**100%**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂ	2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151 9152 9153 9154 9155 9160 9180	ගොඩනැගිලි හා ව්‍යුහයන් යන්ත්‍රෝපකරණ ඉඩම් අස්පෘශ්‍ය වත්කම් ජීව විද්‍යාත්මක වත්කම් කෙරිගෙන යන වැඩ බදු දෙන ලද වත්කම්	නැත			

- ස්ථාවර වත්කම් CIGAS ගිණුම් ක්‍රමය යටතේ ගිණුම් තැබීමක් සිදු නොවේ. මෙය සමාගම් අරමුදල යටතේ ගිණුම් තබනු ලබයි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ටීඒසී/ඒ/ආර්ඕසී/එෆ්එස්/2025/31 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2026 මැයි 29 දින

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව.

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
04 JUN 2026
ශ්‍රී ලංකා

ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යථෝක්ත වාර්තාව හා සහතික කළ මූල්‍ය ප්‍රකාශනයේ මුල් පිටපත (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) මේ සමඟ එවා ඇත.

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
04 JUN 2026
ගිණුම් අංශය

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් නිළ මැදිරිය
04 JUN 2026
ලැබුණා

එම්.ඩී සුදර්ශනී අමරතුංග
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : 1. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - සම්පිණ්ඩන වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනවල පිටපත මේ සමඟ ඉදිරිපත් කරමි.

2. ලේකම්, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය எனது இல. My No. } ටීඑස්සී/ඒ/ආර්ඕසී/එෆ්එස්/2025/3 | ඔබේ අංකය உமது இல. Your No. } | දිනය திகதி Date } 2026 මැයි 29 දින

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව.

ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය (සංශෝධිත) ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් ශීර්ෂ 2003.02.10 යටතේ වූ රු.762,846 ක සමාගම් රෙජිස්ට්‍රාර් ගාස්තු ආදායමක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාරයට ගෙවිය යුතු 2025 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ආදායම් සංකේත 2003.02.10 හි ආදායම වූ රු.521,456,133 න් රු.260,498,358 ක් භාණ්ඩාගාරයට ලබා දී තිබූ රු. මිලියන 5,700 ක අත්තිකාරමට හිලව් කර තිබුණ ද ඒ සඳහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. තවද මෙම හිලව් කිරීම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරද නොතිබුණි.

(ඇ) පොදු කොන්ත්‍රාත් පනත යටතේ අයකරනු ලබන ගාස්තු (2003.02.12) භාණ්ඩාගාර පොත් අනුව රු.84,710,000 ක් වුවද දෙපාර්තමේන්තු මාසික ගිණුම් ප්‍රකාශ අනුව රු.84,698,000 ක් වූයෙන් රු.12,000 ක වෙනසක් පැවතුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ පොදු කොන්ත්‍රාත් පනත යටතේ අයකරගනු ලැබූ රු.130,000 ක ගාස්තුවක් ආදායම් සංකේත 2003.02.12 යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

1.6.2 අග්‍රිම ශේෂය

2025 දෙසැම්බර් 31 දිනට CIGAS පද්ධතියේ ශේෂ පිරික්සුම ප්‍රකාරව වෙනත් මූලාශ්‍ර වලින් අග්‍රිම ගිණුමට රු.365,756,448 ක් හර හා රු.613,096,623 ක් බැර කර තිබුණ ද අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශය වන ඒසිඒ - 3 ආකෘතියෙහි (අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශය) අග්‍රිම ගිණුමට රු.382,640,171 ක් හර හා රු. 629,980,346 ක් බැර ලෙස ඇතුලත් කිරීම හේතුවෙන් ඒසිඒ - 3 ආකෘතියෙහි අග්‍රිමයේ හර ශේෂය හා බැර ශේෂය රු.16,883,723 බැගින් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

	ලේඛන වර්ගය	අදාල රෙගුලාසිය	නිරීක්ෂණය
(අ)	මුදල් පාලන ගිණුම්	මුදල් රෙගුලාසි 142(3)	පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ)	හානි පිළිබඳ ලේඛන	මුදල් රෙගුලාසි 110	යාවත්කාලීන කර නොතිබුණි.
(ඇ)	සෑම ටෙන්ඩර්කරුවකුම හෝ ඒ ටෙන්ඩර්කරු වෙනුවෙන් උප නියෝජිතයකු ලෙස ක්‍රියා කරන සෑම තැනැත්තකුම පිළිබඳ තොරතුරු ඇතුලත් ලේඛනයක්	1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතේ 6 (1) වගන්තිය	පවත්වාගෙන ගොස් නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	ඉකුත් වර්ෂයේ කළමනාකරණ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
(i)	1.2.1 (අ)(i)	හිඟ ආදායම නිවැරදිව වාර්තා කිරීමට හා කඩිනමින් අය කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම	3.1 (ඇ)
(ii)	2.1 (ඇ)	ආදායම් සංකේත 2003.02.10 ආදායම ණය ලෙස ගිණුම්ගත කිරීමට හා හිලවු කිරීමට භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම.	1.6.1(ආ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

(අ) ආදායම් සංකේත 2003.02.10 හා 2003.02.12 යටතේ සමාලෝචිත වර්ෂයේ ආදායම රු.606,166,133 ක් වුවද සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.503,000,000 ක් වූ බැවින් රු.103,166,133 ක් අඩුවෙන් ආදායම ඇස්තමේන්තු කර තිබුණි. එහිදී, සමාලෝචිත වර්ෂයේ සත්‍ය ආදායම සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සියයට 20 කින් ඉක්මවා තිබුණි. ඒ අනුව මුදල් රෙගුලාසි 128 (2)(අ) ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තු සම්පූර්ණ ලෙසත් හැකිතාක් නිවැරදිවත් පිළියෙල කළ යුතු වුවද ඌන ඇස්තමේන්තු සකස් කර තිබුණි.

(ආ) 1891 අංක 16 දරන සමිති ආඥා පනතේ 8 (1) (ඈ) වගන්තිය අනුව ලියාපදිංචි සමිති වාර්ෂික වාර්තා ගොනු කිරීම සිදු කළ යුතුය. 2025 ජනවාරි 01 දින සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා සමිති 217 ක් පමණක් වාර්ෂික වාර්තා ගොනු කර තිබූ අතර ක්‍රියාකාරී සමිති කොපමණ සංඛ්‍යාවක් පවතී ද යන්න නිවැරදිව හඳුනාගෙන නොතිබීම හේතුවෙන් රජයට අය විය යුතු වාර්ෂික වාර්තා ගොනු කිරීමේ ආදායම හා හිඟ ආදායම නිවැරදිව ගණනය කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයෙහි (ඒසිඒ -1(i)) සමාලෝචිත වර්ෂයේ අවසානයට හිඟ ආදායම ලෙස 2024 ජූනි 30 දිනට ශේෂය වූ රු.1,780,110,300 ක් පමණක් දක්වා තිබුණි. ඒ අනුව, මුදල් රෙගුලාසි

128(2),175(2) හා176 ප්‍රකාරව කටයුතු කර ලැබිය යුතු ආදායම් එකතු කර ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කර නොතිබුණි.

(ඇ) සමාගම් අරමුදලින් 2012, 2013, 2014 සහ 2020 යන වර්ෂවල දී එකතුව රු. මිලියන 5,700 ක් අත්තිකාරම් ලෙස මහා භාණ්ඩාගාරයට ලබා දී තිබුණි. 2020 මාර්තු 02 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව එම මුදල් ඒකාබද්ධ අරමුදලේ ආදායමක් ලෙස ගිණුම්ගත කර ඇති බව දන්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාණ්ඩාගාර පොත්වල ණය අත්තිකාරමක් ලෙස දක්වා නොතිබුණි.

3.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.3 ඡේදය ප්‍රකාරව විගණන විමසුම් 12 කට පිළිතුරු ලබා දී නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති/ විධානයට යොමුව	නිරීක්ෂණය
(අ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 527(1) වගන්තිය	විගණකවරයකුවීමට අවශ්‍ය සුදුසුකම් හා ලියාපදිංචි කිරීමේ කාර්යපටිපාටිය සම්බන්ධයෙන් නියෝග යාවත්කාලීන නොකිරීම හේතුවෙන් (145 වන අධිකාරිය වූ) සමාගම් ආඥා පනතේ 1964 සමාගම් (ගණන් පරීක්ෂක) නියෝග යටතේ විගණකවරුන් ලියාපදිංචි කිරීම සිදුකරමින් පැවතුණි.

(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 176 (1)	2025 ජුනි 30 දිනට හා 2025 දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ යුතු හිඟ රාජ්‍ය ආදායම් පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කොට විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සඳහා ආදායම් හිඟහිට ඇති සමාගම් හඳුනාගැනීමට හා අයකරගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.
(ඇ)	2023 අංක 01 දරන සමාගම් (ලේකම්වරුන් පිළිබඳ) නියෝගයේ 10 හා 13 වගන්ති	සමාගම් ලේකම්වරුන්ගේ තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබූ අතර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පල කරද නොතිබුණි.
(ඇ)	සමාගම් ආඥා පනතේ 1964 සමාගම් (ගණන් පරීක්ෂක) නියෝග 2 වගන්තිය	අදාල නියෝග යටතේ වන කාර්යයන් ඉටුකිරීමට උපදේශක මණ්ඩලයක් පත්කර නොතිබුණි.
(ඉ)	2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අංක 3.1 ඡේදය	දෙපාර්තමේන්තුවේ සංචිත වාහන 04 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි.
(ඊ)	මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2023 අගෝස්තු 24 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2023 හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2024 ජූලි 04 දිනැති අංක BD/GPS/2017/Vehicle Remittal (iii) දරන ලිපිය	ජාතික අයවැය දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් 2024 ජූලි 04 දින මෙම දෙපාර්තමේන්තුවට පවරා දී තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම වාහනය ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 හා 612 වැනි අධිකාරය වන රජයේ ඇප ආඥා පනත ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.2 පාඩු හා හානි

(අ) 2023 ඔක්තෝබර් 17 දිනැති අංක 2354/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නිවේදනය කරන ලද ගාස්තු සංශෝධන ඇතුළත් නව සමාගම් (ගාස්තු) නියෝග උපලේඛනය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් 2023 ඔක්තෝබර් 17 සිට 2025 සැප්තැම්බර් 15 දක්වා කාලපරිච්ඡේදය තුල රු.388,822,900 ක ආදායමක් අඩුවෙන් අයකර තිබූ බැවින් එම කාලපරිච්ඡේදය තුල ඒකාබද්ධ අරමුදලට අහිමි වී තිබූ ආදායම රු.129,607,633 ක් විය.

(ආ) 2023 අංක 01 දරන සමාගම් (ලේකම්වරුන් පිළිබඳ) නියෝගයේ (7) වගන්තිය ප්‍රකාරව ලේකම්වරුන් වෙත නිකුත් කරන වෘත්තියේ යෙදීමේ සහතිකය පසුව එළඹෙන වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා වලංගු වේ. නමුත් මෙම නියෝගය සංශෝධනය කිරීමකින් තොරව 2024 දෙසැම්බර් 26 දින දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ සමාගම් ලේකම්වරු ලියාපදිංචිය අළුත් කිරීම නැවත දැනුම් දෙන තුරු නවතා ඇති බවට දැන්වීමක් පලකර තිබීම හේතුවෙන් 2025 වර්ෂයට අදාලව පෞද්ගලික ලේකම්වරු 1426 ක් හා ආයතන 384 ක් ද, 2026 වර්ෂයට අදාලව පෞද්ගලික ලේකම්වරු 2,593 ක් හා ආයතන 600 ක් ද වශයෙන් වූ ලේකම්වරුන්ගේ ලියාපදිංචිය අළුත්කිරීමෙන් ලැබිය යුතු රු.14,964,500 ක ආදායමක් අහිමි වී තිබුණි.

4.3 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2024 වර්ෂයට හා 2025 වර්ෂයට අදාළ පහත සඳහන් විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

	විගණන විමසුම් අංකය	විෂයගත කරුණු	නිකුත් කළ දිනය
(අ)	ටීඒසී/ඒ/ආර්ඕසී/ඒකිව 03/24/C/11	සමාගම් ලිපිගොනු පරීක්ෂාව	2024.12.10
(ආ)	ටීඒසී/ඒ/ආර්ඕසී/ඒකිව 12/24/B/27	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක	2025.04.21

		05/2008 අනුව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙහි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළිබඳ පරික්ෂාව	
(ඇ)	ටීඒසී/ඒ/ආර්ඕසී/ඒකිව 03/25/B/06	සමාගම් රෙජිස්ට්‍රාර් ගාස්තු පරික්ෂාව	2025.11.13
(ඇ)	ටීඒසී/ඒ/ආර්ඕසී/ඒකිව 04/25/A/10	නිලධාරීන් සඳහා රාජකාරි පැවරීම්	2025.12.12
(ඉ)	ටීඒසී/ඒ/ආර්ඕසී/ඒකිව 06/25/A/05	සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තු ඇවර අංශයට අදාල පරික්ෂාව	2026.01.14
(ඊ)	ටීඒසී/ඒ/ආර්ඕසී/ඒකිව07/25/A,B/15	2007 අංක 07 දරන සමාගම් පනතේ 4 (2) වගන්තිය පිළිබඳ පරික්ෂාව	2026.01.14
(උ)	ටීඒසී/ඒ/ආර්ඕසී/ඒකිව08/25/B/04	සමාගම් ලේකම්වරු ලියාපදිංචි කිරීම	2026.01.23
(ඌ)	ටීඒසී/ඒ/ආර්ඕසී/ඒකිව09/25/ A /20	රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම	2026.02.06
(එ)	ටීඒසී/ඒ/ආර්ඕසී/ඒකිව12/25/A,B /04	e- Roc පද්ධතියේ form 02 සිට form 10 දක්වා පරික්ෂාව	2026.03.06
(ඒ)	ටීඒසී/ඒ/ආර්ඕසී/ඒකිව14/25/A/23	සේවක නිවාඩු	2026.03.24
(ඔ)	ටීඒසී/ඒ/ආර්ඕසී/ඒකිව13/25/ B /15	විගණකවරුන් ලියාපදිංචි කිරීම	2026.03.19
(ඕ)	ටීඒසී/ඒ/ආර්ඕසී/ඒකිව16/25/ A /07	සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තු නිලහාර ගැණුම්කර ඒකකයට අදාල පරික්ෂාව	2026.04.24

4.4 කළමනාකරණ දුර්වලතා

(අ) 2023 අංක 01 දරන සමාගම් (ලේකම්වරුන් පිළිබඳ) නියෝග 5(2) ප්‍රකාරව ලේකම්වරයෙකු ලෙස වෘත්තීයේ යෙදීමේ සහතිකයක් නිකුත් කිරීමේදී ලේකම් කාර්ය ක්ෂේත්‍රයෙහි අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයක් සැපයීම සඳහා නිර්මාණය කරන ලද වැඩසටහනක් හදාරා ඇති බවට වූ සහතිකයක් සමඟ ඉදිරිපත් කළ යුතු වුවද එවැනි සහතික ඉදිරිපත් නොකල පුද්ගලයින් 1167 දෙනෙකුට 2024 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දක්වා සමාගම් ලේකම්වරුන් ලෙස වෘත්තියෙහි යෙදීමේ සහතික නිකුත් කර තිබුණි.

(ආ) විගණකවරුන් ලියාපදිංචි කිරීම් සඳහා 2025 නොවැම්බර් 27 දින පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන්ගෙන් විෂයන් 05ක් යටතේ දැනුම පරීක්ෂාවට ලක් කර ලකුණු ලබා දී තිබුණ ද එම විෂයයන් යටතේ සම්මුඛ පරීක්ෂණයේ දී ආවරණය වන

විෂයය නිර්දේශයක් හඳුන්වා දී නොතිබූ අතර සම්මුඛ පරීක්ෂණය සමත් වීමට අවශ්‍ය අවම ලකුණු සංඛ්‍යාව කලින් තීරණය කරද නොතිබුණි. ඒ අනුව අයදුම්කරුවන්ගේ සමත්/අසමත් බව තීරණය කරන ලද ආකාරය ගැටළු සහගත විය.

(ඇ) 1988 ජූලි 01 දින සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගේ වර්ෂ 20 කට වැඩි කාලයක සිට පැවතෙන රු.77,266 ක් වූ ණය ශේෂය 2026 අප්‍රේල් 30 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ වැඩබලන නිලධාරීන් දෙදෙනකුගේ පැමිණීම තහවුරු කර ගැනීම සඳහා කිසිදු ලේඛනයක් නඩත්තු කර නොතිබූ අතර පැමිණීම තහවුරු කරගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.708,645 ක වැඩබැලීමේ දීමනා එම නිලධාරීන් දෙදෙනාට ගෙවා තිබුණි.

5. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

2025 සැප්තැම්බර් මස 01 දිනැති අංක 05/2008 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආයතනවල පිහිටුවන ලද අභ්‍යන්තර කටයුතු ඒකකය ආයතනය විසින් සපයනු ලබන සේවාවන් සංක්ෂිප්ත වශයෙන් දක්වන පුරවැසි ප්‍රඥප්තියක් සකස් කර ප්‍රකාශයට පත් කිරීම සිදු කළ යුතු අතර ශ්‍රී ලංකා දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025 – 2029 හි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර ප්‍රකාශයට පත් කිරීම ක්‍රියාකාරකමක් ලෙස හඳුනාගෙන තිබුණි. එසේ වුවද දෙපාර්තමේන්තුව විසින් 2026 අප්‍රේල් 30 දින වන විටත් පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කර ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර නොතිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

(අ) දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයෙහි ප්‍රධාන අභ්‍යන්තර විගණක 2025 ඔක්තෝබර් 31 දින විශ්‍රාම ගොස් තිබූ අතර එදින සිට එම තනතුර පුරප්පාඩුව පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් පිළියෙල කර තිබූ අවදානම් ලේඛනය 2025 අනුව අවදානම් ක්ෂේත්‍ර 05 ක් යටතේ විගණන ක්‍රියාකාරකම් 19 ක් මිනිස් දින 242 කින් නිමකිරීමට සැලැසුම් කර තිබුණි. එසේ වුවද සමාගම් පනත යටතේ ලියාපදිංචි විදේශ සහ අක්වෙරළ සමාගම් පරීක්ෂාව යන විගණන ක්‍රියාකාරකම පමණක් සමාලෝචිත වර්ෂයේ දී මිනිස් දින 10 ක් තුල සිදු කර තිබුණි. එ් අනුව මිනිස් දින 232 ක් තුල සිදු කිරීමට සැලසුම් කළ ක්‍රියාකාරකම් 17 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක

කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු ප්‍රමාණවත් පරිදි සිදු කර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලය 187 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 125 ක් වූයෙන් පුරප්පාඩු 62 ක් විය.

(ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රධානී තනතුර වන සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර 2021 ජනවාරි 02 දින සිට පුරප්පාඩුව පවතින අතර 2021 ජූලි 08 දින සිට අවස්ථා 03 කදී නිලධාරීන් තිදෙනකු වැඩ බැලීම සඳහා පත්කර තිබුණ ද තනතුර සඳහා පූර්ණ කාලීනව නිලධාරියෙක් 2026 අප්‍රේල් 30 දින වන විටත් පත් කර නොතිබුණි. තවද සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් (පාලන) තනතුර අනුමත කර තිබූ 2016 ඔක්තෝබර් 24 දින සිට 2026 අප්‍රේල් 30 දින දක්වා රාජකාරී ආවරණය සහ වැඩ බැලීමට නිලධාරීන් පත් කර තිබුණද පූර්ණ කාලීනව නිලධාරියෙක් පත් කර නොතිබුණි. දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී ඉල්ලා අස්වීම මත තනතුර 2023 දෙසැම්බර් 28 දින සිට පුරප්පාඩු වී තිබුණි.

(ඇ) ද්විතියික මට්ටමේ තනතුරක් වන සමාගම් පරීක්ෂක තනතුරු 10 න් 08 ක්ම 2026 අප්‍රේල් 30 දින වන විට පුරප්පාඩුව පැවතුණු අතර භාෂා පරිවර්ථක තනතුරු දෙකම වසර 8 කට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවතුණි.

එම්.ඩී.සුදර්ශනී අමරතුංග
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } ටීඑස්සී/ඒ/ආර්ඔසී/එෆ්එස්/2025/32

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2026 ජූලි 07 දින

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
13 JUL 2026
15

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
09 JUL 2026
ශ්‍රී ලංකා

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව අංශය

සමාගම් අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

යථෝක්ත වාර්තාව හා සහතික කළ මූල්‍ය ප්‍රකාශනයේ මුල් පිටපත (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) මේ සමඟ එවා ඇත.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්
නිළ මැදිරිය
09 JUL 2026
ලැබුණා

එම්.ඩී සුදර්ශනී අමරතුංග
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : 1. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - සම්පිණ්ඩන වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනවල පිටපත මේ සමඟ ඉදිරිපත් කරමි.

2. ලේකම්, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } ටීඒඕ/ඒ/ආර්ඕසීඑෆ්/එෆ්එස්/25/32 Your No. } දිනය
திகதி
Date } 2026 ජූලි 07 දින

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්

සමාගම් අරමුදල

සමාගම් අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සමාගම් අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ 479(6) වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 ඡේදය ප්‍රකාරව අවසර දී ඇති විටෙක හැර ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවද ජාතික බුද්ධිමය දේපල කාර්යාලයෙන් ලද ආදායමට එරෙහිව සමාලෝචිත වර්ෂයේදී මුදලින් ගෙවන ලද ආරක්ෂක සේවා වියදම් වූ රු. 655,350 ක් හිලව් කර දක්වා තිබුණි. මේ හේතුවෙන් ආදායම් හා වියදම් රු.655,350 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 47 ඡේදය අනුව පූර්ව කාලපරිච්ඡේද වැරදි නිවැරදි කිරීමේදී සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකර පූර්ව වර්ෂ ගැලපුම් ලෙස රු.2,415,570ක් සමුච්චිත අතිරික්තයට බැරකර තිබුණ ද ප්‍රමිතියේ 54 ඡේදය ප්‍රකාර අවශ්‍ය තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරද නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 49 ඡේදය ප්‍රකාර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී සම්පූර්ණ වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් 2023 හා 2024 වර්ෂවලදී කාර්යාල උපකරණවලින් කොටසක් ප්‍රත්‍යාගණනය කර එම වත්කම් සමාලෝචිත වර්ෂයේ ප්‍රත්‍යාගණිත අගයට ද ඉතිරි වත්කම් රු.95,316,369ක් ලෙස පිරිවැයට ද දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10 හි 20 ඡේදය සහ මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 04 ප්‍රකාරව වාර්තාකරණ කාලපරිච්ඡේදයට අදාළ අරමුදලෙහි ආදායම් ගණනය කර හඳුනා ගැනීම වෙනුවට ආදායම් ලෙස මුදලින් ලද ආදායම් පමණක් හඳුනාගෙන තිබුණි.

(ඉ) මූල්‍ය සාධනපත්‍ර හෙළිදරව් කිරීම (SLFRS) අංක 07 හි 08 ඡේදයේ අවශ්‍යතාවය ප්‍රකාරව භාණ්ඩාගාර බැඳුම්කර මූල්‍ය ප්‍රකාශ වල හඳුනාගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ සටහන් 06 හි සඳහන් ප්‍රතිපත්තිය අනුව ආයෝජන මිලට ගනු ලබන අවස්ථාවේදී හඳුනාගනු ලැබූ ආයෝජන උපලබ්ධි කිරීමේ පාඩුව වන රු.181,813,760ක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ගලපා තිබුණි. මේ හේතුවෙන් වත්කමෙහි නිවරදි ධාරණ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි හෝ සටහන් වල හෙළිදරව් වී නොතිබුණි.

(ඊ) 2007 වර්ෂයේදී ඊ සර්විසස් ලංකා සමාගමේ සියයට 35ක රාජ්‍ය දායකත්වය වෙනුවෙන් එම සමාගමේ සාමාන්‍ය කොටස් හා වරණීය කොටස් මිලදී ගැනීම සඳහා වෙළඳ, අලෙවි සංවර්ධන සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශ ලේකම් වෙත ගෙවා තිබූ රු.90,275,000ක් අරමුදලේ ආයෝජනයන් ලෙස දක්වා තිබුණද එම සමාගමේ කොටස් හිමිකමක් අරමුදල සතු බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර එහි පැවැත්ම තහවුරු කරගැනීමට විගණනයට නොහැකි විය.

(උ) සමාලෝචිත වර්ෂයේ අවස්ථා 05කදී රු.819,996,355කට මිලදී ගෙන තිබූ භාණ්ඩාගාර බැඳුම්කර මිලට ගනු ලැබූ අවස්ථාවේදී පැවති එකතුව රු.27,368,484ක් වූ ලැබිය යුතු පොලී හඳුනාගෙන වත්කම් ලෙස දැක්වීම වෙනුවට භාණ්ඩාගාර බැඳුම්කර පොලී ගිණුමට හර කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය සහ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඌ) 2025 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු අන්තර්ජාල ආදායම තුළ ඇතුළත් රු.1,168,168ක් වූ එකතු කළ අගය මත බදු ගෙවිය යුතු වටිනාකමක් ලෙස ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් සහ ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) 2024 වර්ෂයේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන අනුව භාණ්ඩාගාරයට ගෙවූ මුදල රු.432,396,934 ක් වුවද සමාගම් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල රු.432,896,934ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් අරමුදලේ සමුච්චිත අතිරික්තය රු.500,000කින් අවතක්සේරු වී තිබීමේ දෝෂය සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති 1.2 (ඇ) (ඇ) (ඉ) (ඊ) හා (එ) විගණන නිරීක්ෂණ හැර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති/ විධානයට යොමුව	අනුකූල නොවීම
(අ) 2007 අංක 07 දරන සමාගම් පනත (i)4 (2) වගන්තිය	සමාගමක කොටස් හිමියා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව

වෙනුවෙන් කොටස් දරන භාණ්ඩාගාරයේ ලේකම්වරයා හෝ පුද්ගලයකු හෝ සංස්ථාවක් නොවන විට අවම වශයෙන් කොටස් හිමියන් දෙදෙනෙකුවත් සිටිය යුතු වුවද 2020 සිට 2025 දක්වා වර්ෂවල සංස්ථාගත කළ පෞද්ගලික සමාගම් 1500 ක නියදියක් පරීක්ෂාවේදී තනි පුද්ගලික සමාගම් 575 ක් හා පොදු සමාගම් 44 ක් තනිපුද්ගල කොටස් හිමියකු බැගින් ලියාපදිංචිකර සංස්ථාපනය කර තිබුණි.

(ii)51(4) වගන්තිය

කොටස් නිකුත් කල දින සිට වැඩ කරන දින 20ක් ඇතුළත, සමාගම විසින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දිය යුතු අතර එය පැහැර හරින සමාගම් සම්බන්ධයෙන් රු.50,000 ක් නොඉක්මවන දඩයකට යටත් විය යුතුය. එසේ වුවද 2025 දෙසැම්බර් මාසයේදී කොටස් නිකුත් කල සමාගම් පිළිබඳ නියැදි පරීක්ෂාවේදී කොටස් නිකුත් කිරීම සිදු කර දින 31 ත් 261 ත් අතර කාලයක් ගතවී සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත දැනුම්දී තිබූ සමාගම් 14ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර දඩ මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii)394 (3) වගන්තිය

2025 ජනවාරි 01 දින සිට 2025 අගෝස්තු 30 දින දක්වා සමාගම් 141 ක නාමය කපාහැර තිබුණද ඉන් සමාගම් 88 ක් හා සාමාජිකයන් විසින් ස්වේච්ඡාවෙන් ගණන් බෙරා විසුරුවා දැමූ සමාගම් 07 ක් හා අධිකරණය මඟින් ගණන් බෙරා විසුරුවා හරින ලද සමාගම් 04 ක් 2025 සැප්තැම්බර් 01 දින වන විටත් e -Roc පද්ධතියෙහි ලියාපදිංචි සමාගම් ලෙස පැවතුණි.

(i)396 (2) හා 397 වගන්ති	සමාගම් ඇවර කිරීමේ ගිණුමේ බැරට ඇති මුදල් ශේෂය සමාගම් ඇවර කිරීමේදී හිමිකම්පෑම් පිරිමසාලීම සඳහා රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව අවශ්‍ය වන ප්‍රමාණය ඉක්මවන අතිරික්තය භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත දැනුම් දිය යුතු අතර ඔහු විසින් නියම කරනු ලබන ප්‍රමාණය භාණ්ඩාගාරයට ගෙවිය යුතු වුවද සමාගම් ඇවර ගිණුමේ 2001 වර්ෂයේ සිට පවතින රු. 85,253,727ක ශේෂය සම්බන්ධයෙන් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත දැනුම්දී නොතිබුණි.
(ii) 514 වගන්තිය	e – Roc දත්ත පද්ධතිය අනුව සමාගම් අරමුදලට ආදායම් එකතු කිරීමේදී 2022 ජනවාරි 01 සිට 2025 සැප්තැම්බර් 15 දක්වා රු.273,131,500ක් වූ දඩ මුදල් අය කර තිබුණ ද දඩ මුදල් ගාස්තු අයකිරීම් සඳහා සමාගම් රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මුදල් රෙගුලාසි 176 (1)	ගණන්දීමේ නිලධාරියා විසින් හිඟ රාජ්‍ය ආදායම් පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 175(1) (ආ)	මුදල් එකතුකරන නිලධාරීන් විසින් යාවත්කාලීන පාලක ගිණුම් තබාගත යුතු අතර මාසිකව එම පාලක ගිණුම් තනි තනි වාර්තා සමඟ සැසඳිය යුතු වුවද අරමුදලේ e – Roc පද්ධතියට ලැබෙන ආදායම් හා බැංකු ගිණුම් ආදායම් සැසඳීම් සිදු කර නොතිබුණි. නියැදී පරීක්ෂණයක් අනුව 2025 ජූනි මාසයට අදාල e-Roc පද්ධතියේ ආදායම් හා බැංකු ගිණුමට ලද ආදායම් අතර රු.3,064,785 ක වෙනසක් පැවතුණි. එය 2025 දෙසැම්බර් 31 දක්වා සසඳා වෙනසට හේතු හඳුනාගෙන නොතිබුණි.

(ඇ)	2023 ඔක්තෝබර් 17 දිනැති අංක 2354/12 දරන ගාස්තු සංශෝධන අති විශේෂ ගැසට් පත්‍රය	අදාළ සංශෝධිත ගාස්තු ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් 2023 ඔක්තෝබර් 17 දින සිට 2025 සැප්තැම්බර් 15 දක්වා අරමුදලට අයකරගත යුතු රු. 259,215,266 ක ආදායමක් අහිමි වී තිබුණි.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

2025 වර්ෂයේ අවස්ථා 15 කදී රු.3,139,991,315 ක් භාණ්ඩාගාර බැදුම්කර වල ආයෝජනය කර තිබුණ ද ඒ සඳහා සමාගමේ රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ හෝ 2007 අංක 07 දරන සමාගම් පනතේ 479 වන වගන්තිය ප්‍රකාරව අරමුදලේ පරිපාලනය පිළිබඳව වාර්තා කිරීමේ වගකීම් පැවරී ඇති අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

එල්.එස්.අයි. ජයරත්න
විගණකාධිපති

04. කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධනය

විශේෂිත දර්ශක	භෞතික ලියාපදිංචියේ වර්ධනය ප්‍රතිශතයක් ලෙස		
	2024	2025	වර්ධනය ප්‍රතිශතයක් ලෙස
සමාගම් සංස්ථාපනය	27,133	32,782	17.23
සමාගම් ලේකම් ලියාපදිංචිය	1,394	801	-74.03
සමාගම් විගණකවරු ලියාපදිංචිය	442	115	-284.34
පොදු කොන්ත්‍රාත් ලියාපදිංචිය	27,689	42,420	34.72
සමිති ලියාපදිංචිය	39	54	27.77

2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ වර්ෂ අනුව සමාගම් ලියාපදිංචිය

සමාගම් වර්ගය	2018	2019	2020	2021	2022	2023	2024	2025
සී/ස පෞද්ගලික සමාගම්	11,123	11,034	13,350	18,066	17,403	21,798	26,568	32,287
සී/ස පොදු සමාගම්	43	51	48	39	37	97	52	54
ඇපයෙන් සීමිත සමාගම්	160	71	56	125	238	306	126	148
සංගම්	59	177	152	183	126	129	313	208
විදේශීය සමාගම්	41	30	13	20	15	13	14	13
අක්වෙරළ සමාගම්	0	0	0	0	0	33	60	72
පොදු ලැයිස්තුගත සමාගම්	0	0	0	0	0	0	0	0
සීමා රහිත සමාගම්	-	-	-	01	0	0	0	0
නව ලියාපදිංචි සමාගම්	11,426	11,363	13,619	18,434	17,819	22,376	27,133	32,782
මුළු ලියාපදිංචි සමාගම් සංඛ්‍යාව	84,478	95,841	109,460	127,894	145,713	168,089	195,222	228,004
නැවත ලියාපදිංචි සමාගම්	3	3	0	0	0	0	0	0
මුළු නැවත ලියාපදිංචි සමාගම්	25,074	25,077	25,077	25,077	25,077	25,077	25,077	25,077
මුළු එකතුව	**109,552**	**120,918**	**134,537**	**152,971**	**170,790**	**193,166**	**220,299**	**253,081**
නාමය කපා හරින ලද සමාගම් සංඛ්‍යාව	473	485	266	255	265	804	508	271
නාමය කපා හරින ලද මුළු සමාගම් සංඛ්‍යාව	2,956	3,441	3,707	3,962	4,227	5,031	5,539	5,810
ක්‍රියාකාරී මුළු සමාගම් සංඛ්‍යාව	**106,596**	**117,477**	**130,830**	**149,009**	**166,563**	**188,135**	**214,760**	**247,271**

05. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (සියයට)		
			0-49	50-74	75-100
01.දිළිඳුකම තුරන් කිරීම සෑම අතින්ම පවතින කුසගින්න තුරන් කිරීම.	ලියාපදිංචි සමිති සංඛ්‍යාව වැඩි කිරීම	සමිති ලියාපදිංචි කිරීමේ වර්ධන ප්‍රතිශතය (සමිති 54ක් ලියාපදිංචි කර ඇත.)	27.77%	-	-
02.තිරසර පරිපූර්ණ ආර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම පූර්ණ හා ඵලදායිතාවයෙන් යුත් සේවා නියුක්තිය සුරක්ෂිත කිරීම. සියළු දෙනාටම වැදගත් රැකියාවක් කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීම.	01.ලියාපදිංචි කරන සමාගම් සංඛ්‍යාව වැඩි කිරීම	සමාගම් ලියාපදිංචි කිරීමේ වර්ධන ප්‍රතිශතය (නව සමාගම් 32,782 ලියාපදිංචි කර ඇත.)	17.23 %	-	-
	02. ලියාපදිංචි කරන පොදු කොන්ත්‍රාත් සංඛ්‍යාව වැඩි කිරීම	පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීමේ වර්ධන ප්‍රතිශතය	34.72 %	-	-

5.2 <u>තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග</u>

<u>තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක</u>

එක්සත් ජාතීන්ගේ 70 වන මහා සමුළුවේදී එළිදක්වන ලද අරමුණු 17 අතරින් අප දෙපාර්තමේන්තුව වෙත අදාලවන අරමුණු 02 ක් හඳුනාගෙන ඇත.

01. **දිළිඳුකම තුරන් කිරීම සෑම අතින්ම පවතින කුසගින්න තුරන් කිරීම**.

මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන සමිති සංඛ්‍යාව වැඩි කර ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම ඉලක්ක කරගෙන කටයුතු කිරීම මගින් මෙම අරමුණ ඉටු කරගැනීමේ හැකියාව ඇත. අඩු ආදායම්ලාභීන් හා ග්‍රාමීය ජනයාගේ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීමත්, ජීවන තත්ත්වය උසස් කිරීමත් අරමුණු කරගත් බොහෝ සමිති සමාගම් බිහි වී ඇත. මෙම සමිති ලියාපදිංචි කිරීම මඟින් ඒවාට නෛතික තත්ත්වයක් ලැබෙන අතර ඒවා නියාමනය කිරීම ද පහසු වේ. එමගින් එම සමිති සමාගම් වලට අදාල ජනකොටස් වෙත එහි ප්‍රතිලාභ ලැබෙන බවට තහවුරු කරගත හැක. ඒ අනුව 2024 වර්ෂයට වඩා මෙම වර්ෂයේ ද සුභසාධක සමිති වැඩිවශයෙන් ලියාපදිංචි කිරීම දැකගත හැකි අතර 2025 වර්ෂයේදී නව සමිති 54ක් ලියාපදිංචි කර ඇත.

02. තිරසර පරිපූර්ණ ආර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම පූර්ණ හා ඵලදායිතාවයෙන් යුත් සේවා නියුක්තිය සුරක්ෂිත කිරීම. සියළු දෙනාටම වැදගත් රැකියාවක් කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීම.

වෙළඳ ප්‍රජාව ඉලක්ක කර ගෙන සමාගම් සංස්ථාපනයට හා පවත්වාගෙන යාමට අදාල සේවාවන් වෙත ප්‍රවේශවීමේ අවස්ථාවන්, හැකියාවන් හා පහසුකම් ප්‍රවර්ධනය කිරීමෙන් මෙම අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කරනු ලැබේ. ඒ සඳහා ලියාපදිංචි කරන සමාගම් සංඛ්‍යාව වැඩි කිරීම එනම් සමාගම්, සංවිධාන, පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීම වැඩි කර ව්‍යාපාර ක්ෂේත්‍රය පුළුල් කිරීමටත් එමගින් ආර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම හා වැදගත් රැකියාවක් කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීමට අවස්ථාව පුළුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

ජයග්‍රහණ

- මෙම දෙපාර්තමේන්තුවේ සියළු කටයුතු මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කරන බැවින් සමිති, සමාගම් හා පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීමත් ඒවාට අදාළ වෙනත් ලේඛන යාවත්කාලීන කිරීමත් සියල්ල මහජනතාවට පහසුවෙන් මාර්ගගතව සිදු කර ගත හැකි වීම නිසා ඔවුන්ගේ කාලය, මුදල් හා ශ්‍රමය ඉතිරි කර ගත හැකිය.

- 2024 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂයේ දී සමිති ලියාපදිංචි කිරීමත්, සමාගම් ලියාපදිංචි කිරීමත්, පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීමත් සැලකිය යුතු ලෙස වර්ධනය වීමක් නිරීක්ෂණය කළ හැක.

	2024	**2025**
සමිති ලියාපදිංචි කිරීම	39	54
සමාගම් ලියාපදිංචි කිරීම	27,133	32,782
පොදු කොන්ත්‍රාත් ලියාපදිංචිය	27,689	42,420

- සේවා කටයුතු මාර්ගගත ක්‍රමය මගින් ලබාදීම හේතුවෙන් කඩදාසි මුක්ත වීමත්, කාලය හා ශ්‍රමය ඉතිරි වීමත්, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ යාමත් සිදු වී ඇත.

අභියෝග

- මෙම දෙපාර්තමේන්තුවේ සියළුම සේවාවන් මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදුකරන අතර සෑම ප්‍රදේශයකම අන්තර්ජාල පහසුකම් නිසි පරිදි නොමැති වීම හේතුවෙන් මහජනතාවට මාර්ගගත ක්‍රමය ඔස්සේ සේවා සපයාගැනීමේ අපහසුතා පැවතිය හැක. එසේම මාර්ගගත ක්‍රමය මඟින් අයදුම්පත් ඉදිරිපත් කිරීමට ග්‍රාමීය ජනතාවට දැනුම මද කම හා ඔවුන් යාවත්කාලීන නොවීම නිසා සමිති ලියාපදිංචි කිරීමේ යම් අඩු අගයක් පැවතීම අභියෝගයක් වුව ද එවැනි අපහසුතා පවතින සේවාදායකයින්ට කාර්යාලයට පැමිණ සේවා ලබා ගැනීමේ අවස්ථාව ද සලසා දී තිබේ.

- වාර්ෂිකව අළුතින් ලියාපදිංචි වන සමාගම් සංඛ්‍යාව වැඩි වුව ද ඊට සාපේක්ෂව දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව වැඩි නොවීම හමුවේ කාර්යක්ෂමව හා ඉක්මන් සේවාවක් ලබා දීම ගැටළුවක් වී ඇත.

06. මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	18	09	09
තෘතීයික	06	03	03
ද්විතීයික	130	91	39
ප්‍රාථමික	32	23	09

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය

2007 අංක 07 දරණ සමාගම් පනත, සමිති ආඥාපනත - 123 වන අධිකාරිය, 1935 අංක 61 දරණ සීට්ටු ආඥාපනත, 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත මගින් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති මූලික කාර්යයන් ඉටු කිරීමත් , නියාමනය හා මෙහෙයවීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන අතර ඊට අදාළ සියළු කාර්යයන් ඵලදායීව හා කාර්යක්ෂමව සිදු කරමින් මහජනතාව වෙත ප්‍රශස්ත සේවාවක් ලබා දීම මෙම දෙපාර්තමේන්තුවේ අවසාන ඉලක්කය වේ.

ඒ අනුව ඒ සඳහා දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය අවශ්‍ය පමණ සිටීම අත්‍යාවශ්‍ය කරුණක් වන අතර එම අවශ්‍යතාවය සම්පූර්ණ නොවීම මත විවිධ ගැටළුකාරී තත්වයන් මතුවී තිබේ.

e-ROC පද්ධතිය මඟින් සමාගමක නාමය අනුමත කිරීමේ සිට සමාගමක් ඇවර කිරීම දක්වා සියළුම කටයුතු සිදු කරනු ලබන අතර එම පද්ධතිය එක් එක් මට්ටම් අනුව අයදුම්පත් අනුමත කිරීම් කටයුතු සිදු කරයි. එහි දී නියෝජ්‍ය/ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් මට්ටමේ තනතුරු ප්‍රමාණය අඩු බැවින් පහළ මට්ටම් වලින් පැමිණෙන අයදුම්පත් සියල්ල තනතුරු 5ක් වැනි ඉතා කුඩා තනතුරු ප්‍රමාණයක් වෙත එක් රැස්වීම සිදුවේ. සමාගම් සම්බන්ධව විවිධ සේවා අවශ්‍යතා මත දිනකට අයදුම්පත් සැලකිය යුතු ප්‍රමාණයක් ලැබෙන අතර මෙම තනතුරු වල පවතින පුරප්පාඩු හේතුවෙන් කල්පසුවූ වැඩ ගොඩ ගැසීමත් මේ නිසා සේවාලාභීන්ගේ සේවා අවශ්‍යතා ඉටු කිරීමේදී ප්‍රමාදවීම් සිදු වීමත් සිදු වේ. එබැවින් මෙම තනතුරු වල පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමත් දෙපාර්තමේන්තුගත විධායක මට්ටමේ අනුමත තනතුරු ප්‍රමාණය වැඩි කර ගැනීමට කටයුතු කිරීමටත් අපේක්ෂා කෙරේ.

එසේම e-ROC පද්ධතියේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කරනු ලැබූ පෞද්ගලික ආයතනයෙන් පද්ධතිය මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමත් සමඟ එහි සියළුම මෙහෙයුම් හා නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය වෙත භාර විය. නමුත් මෙම දෙපාර්තමේන්තුවේ අනුමත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ තනතුරු අතරින් තත්‍ය

නිලධාරීන් සංඛ්‍යාව ද අඩක් පමණ සිටින අතර එම නිලධාරීන්ට ද අවශ්‍ය තාක්ෂණික දැනුම ප්‍රමාණවත්ව නොතිබීමත්, නිලධාරීන් හිඟකමත්, බාහිර ආයතනවල තොරතුරු තාක්ෂණ දැනුම සහිත නිලධාරීන්ගේ සහාය ලබාගනිමින් කාර්යයන් සිදුකරගෙන යාමට සිදු වීමත් නිසා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ කටයුතුවලදී මානව සම්පත් හිඟය දැඩිව බලපා ඇති බව කිව හැකිය.

මෙම දෙපාර්තමේන්තුවේ සමාගම් සම්බන්ධ නීතිමය කටයුතු සඳහා ඉතා අත්‍යාවශ්‍ය තනතුරු ලෙස නීති නිලධාරී තනතුර හා සමාගම් පරීක්ෂක තනතුර හැඳින්විය හැකි අතර මේ වන විට නීති නිලධාරී තනතුර මෙන්ම අනුමත සමාගම් පරීක්ෂක නිලධාරී තනතුරු අතරින් තනතුරු 08ක් පුරප්පාඩු ලෙස පැවතීම නිසා නීතිමය කටයුතු වලදී විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුව ඇත.සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ පාලනය හා අධීක්ෂණය යටතේ සමාගම් පනත උල්ලංඝනය කරන සමාගම් පිළිබඳව නීතිමය කටයුතු ඉටු කිරීමට සහාය වීම මෙම තනතුරුවලට අයත් ප්‍රධාන කාර්යයක් වේ. මෙම තනතුරු සැලකිය යුතු කාලයක් පුරප්පාඩු ලෙස පැවති අතර 2025 වර්ෂයේදී මෙම තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවාගැනීමට අනුමැතිය ලබා ගත හැකි වූ අතර ඉදිරි වර්ෂය තුළ එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අපේක්ෂා කෙරේ.

මෙම දෙපාර්තමේන්තුව සඳහා අනුමතව පවතින ශ්‍රී ලංකා පරිපාලන සේවයට අයත් එකම තනතුර සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්(පාලන) තනතුර වන අතර එම තනතුර ද පුරප්පාඩු ලෙස පැවතීම දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු වලදී අඩුපාඩුවක් ලෙස දැක්විය හැක. 2025 වර්ෂයේ තුන්වන කාර්තුව තෙක් වැඩ බැලීමේ පදනමින් නිලධාරියෙකු අනුයුක්ත කර ඇතත්, මෙම දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු සම්බන්ධව නිලධාරීන් මෙහෙයවීමේ දී නිවැරදි උපදෙස් නොලැබීම මෙන්ම පරිපාලන කටයුතු සම්බන්ධ තීරණ ගැනීමේ දී අදාළ දැනුම හා පළපුරුද්ද නොමැතිකම නිසා ද විවිධ ගැටළු වලට මුහුණ දීමට සිදු වේ. එබැවින් පරිපාලන කටයුතු සම්බන්ධව මනා දැනුමක් හා පළපුරුද්දක් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු ස්ථිර වශයෙන් අනුයුක්ත කර දෙන මෙන් ඉල්ලා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් සිදු කර ඇති අතර මෙය දෙපාර්තමේන්තුවේ දැඩි අවශ්‍යතාවයකි.

එසේම ගණකාධිකාරී II/III ශ්‍රේණියේ තනතුරක් දෙපාර්තමේන්තුව සඳහා අනුමත කරගෙන ඇත්තෙ එවැනි නිලධාරයෙකුගේ සේවය අත්‍යාවශ්‍ය වන බැවින් වුවද ඒ සඳහා ස්ථිර වශයෙන් නිලධාරියෙකු අනුයුක්ත කරගත නොහැකි වීම ද ගැටළුකාරී තත්වයකි.

එසේම මෙම දෙපාර්තමේන්තුවේ අනුමතව පවතින ගොඩනැගිලි ඕවර්සියර් තනතුර සඳහා ද නිලධාරියෙකු බඳවාගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඉදිරි වර්ෂයේදී එම බඳවාගැනීම සිදුකර ගැනීම අත්‍යාවශ්‍ය කරුණකි.

මීට අමතරව භාෂා පරිවර්තක තනතුරු 02ක්, කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 12ක්, සංවර්ධන නිලධාරී තනතුරු 14ක්, කාර්යාල සේවක සේවයේ තනතුරු 08ක්, රියදුරු තනතුරු 01ක් ආදී වශයෙන් තවදුරටත් කාර්යමණ්ඩලයේ පවතින පුරප්පාඩු හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කාර්යයන් සහ e–ROC ව්‍යාපෘතිය අඛණ්ඩව නිරවුල්ව පවත්වාගෙන යාමට බාධාවක් වී ඇති අතර එය අප මුහුණදෙන ප්‍රධාන අභියෝගයක් ද වී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධන

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව		වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම
					දේශීය	විදේශීය		
01	New Procurement Guidelines (2024) පිළිබඳ පුහුණු පාඨමාලාව	01	බී.ඒ.ආර්.එන්.බාලසූරිය මිය - ගණකාධිකාරී I	2025.02.20 හා 21	10,000/-	-	දේශීය	රාජකාරී ස්වභාවය අනුව දැනුම් යොදා ගෙන ඇත.
02	New Procurement Guidelines (2024) පිළිබඳ පුහුණු පාඨමාලාව	01	පී.ජී.කේ.එස්.පෙරේරා මයා - ක.සේ.නි.	2025.02.13	14,000/-	-	දේශීය	රාජකාරී ස්වභාවය අනුව දැනුම් යොදා ගෙන ඇත.
03	New Procurement Guidelines (2024) පිළිබඳ පුහුණු පාඨමාලාව	01	බී.ඒ.ආර්.එන්.බාලසූරිය මිය - ගණකාධිකාරී I	2025.06.19	18,500/-	-	දේශීය	රාජකාරී ස්වභාවය අනුව දැනුම් යොදා ගෙන ඇත.
04	හානි, පාඩු හා මු.රෙ.104 යටතේ වූ පරීක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව	01	සී.ඩී.පනාගොඩ මිය පරිපාලන නිලධාරී	2025.06.19	6,500/-	-	දේශීය	රාජකාරී ස්වභාවය අනුව දැනුම් යොදා ගෙන ඇත.
05	ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහායකයින්ගේ හා රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය පිළිබඳ පුහුණු පාඨමාලාව	02	ඊ.එන්.ප්‍රියදර්ශනී මිය - කා.සේ.සේ. බී.එම්.ඩී.රණසිංහ මයා - රියදුරු	2025.06.24	13,000/-	-	දේශීය	රාජකාරී ස්වභාවය අනුව දැනුම් යොදා ගෙන ඇත.
06	නිවාඩු විෂයභාර නිලධාරියාගේ කාර්යභාරය හා වගකීම් පිළිබඳ පුහුණු පාඨමාලාව	01	ඩී.එම්.සී.ඩී.දිසානායක මිය - සං.නි	2025.06.26	6,500/-		දේශීය	රාජකාරී ස්වභාවය අනුව දැනුම් යොදා ගෙන ඇත.
07	Certificate Program on SLPSAS පිළිබඳ පුහුණු පාඨමාලාව	01	බී.ඒ.ආර්.එන්.බාලසූරිය මිය - ගණකාධිකාරී I	2025.07.17 හා 18	10,000/-		දේශීය	රාජකාරී ස්වභාවය අනුව දැනුම් යොදා ගෙන ඇත.

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව		වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම
					දේශීය	විදේශීය		
08	පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායී ආයුරින් පවත්වාගෙන යාම පිළිබඳ පුහුණු පාඨමාලාව	01	කේ.ඒ.සී.එච්.තිලකරත්න මිය - සං.නි.	2025.07.29	6,500/-		දේශීය	රාජකාරී ස්වභාවය අනුව දැනුම යොදා ගෙන ඇත.
09	Government Payroll System පිළිබඳ පුහුණු පාඨමාලාව	01	එෆ්.එස්.නිසාර් මිය - ක.සේ.නි.	2025.07.30 හා 31	15,000/-		දේශීය	රාජකාරී ස්වභාවය අනුව දැනුම යොදා ගෙන ඇත.
10	Training on IT Procurement in the public Sector	01	බී.ඒ.ආර්.එන්.බාලසූරිය මිය - ගණකාධිකාරී I	2025.09.10 හා 11	10,000/-		දේශීය	රාජකාරී ස්වභාවය අනුව දැනුම යොදා ගෙන ඇත.
11	Government Payroll System පිළිබඳ පුහුණු පාඨමාලාව	01	ආර්.ඩී.එස්.මදුමාලි මිය - සං.නි.	2025.09.01,02 හා 03	18,000/-		දේශීය	රාජකාරී ස්වභාවය අනුව දැනුම යොදා ගෙන ඇත.
12	Competency Development for Receptionists/ Telephone Operators පිළිබඳ පුහුණු පාඨමාලාව	01	අයි.ඒ.ඒ.සිරිවර්ධන මයා - කාර්යාල සේවක සේවය	2025.08.20	6,500/-		දේශීය	රාජකාරී ස්වභාවය අනුව දැනුම යොදා ගෙන ඇත.
13	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	01	පී.ඩී.යූ.ටී. ද සිල්වා මිය - ක.සේ.නි.	2025.07.15 දින සිට 2025.09.16 දක්වා දින 10 දී පැවැත්වීය.	30,000/-		දේශීය	රාජකාරී ස්වභාවය අනුව දැනුම යොදා ගෙන ඇත.
14	Speechcraft Program with Toastmasters International	02	පී.පී.එස්.හර්ෂණී මිය - සමාගම් රෙජිස්ට්‍රාර් එල්.කේ.එස්.ධර්මකීර්ති මිය - සමාගම් රෙජිස්ට්‍රාර්	දිනකට පැය 02ක් වන සේ සතියට දිනක් බැගින් සති 10 ක්	35,000/- 35,000/-		දේශීය	රාජකාරී ස්වභාවය අනුව දැනුම යොදා ගෙන ඇත.
15	Training on Accrual Based Public Financial Accounting & Reporting	01	බී.ඒ.ආර්.එන්.බාලසූරිය මිය - ගණකාධිකාරී I	2025 දෙසැම්බර් මස මුල සිට මාස 03දක්වා සැසි 15	15,000/-		දේශීය	රාජකාරී ස්වභාවය අනුව දැනුම යොදා ගෙන ඇත.

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව		වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම
					දේශීය	විදේශීය		
16	ආයතන සංග්‍රහය හා මූදල් රෙගුලාසි පිළිබඳ පුහුණු පාඨමාලාව	31	කලමණාකරණ සේවා නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් 15 දෙනෙකු හා 16 දෙනෙකු බැගින් කණ්ඩායම් 02කට පුහුණුවට යොමු කරන ලදී.	2025.10.10, 2025.10.14, 2025.11.25, 2025.12.12	417,850/-		දේශීය	රාජකාරි ස්වභාවය අනුව දැනුම යොදා ගෙන ඇත.
17	වැඩ, භාණ්ඩ, උපදේශණ නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ නව වෙනස්කම් පිළිබඳ පුහුණුව	01	සී.ඩී.පනාගොඩ මිය - පරිපාලන නිලධාරී	2025.11.26 හා 27	13,000/-		දේශීය	රාජකාරි ස්වභාවය අනුව දැනුම යොදා ගෙන ඇත.
18	වැටුප් පරිවර්තනය පිළිබඳව පුහුණුව	02	බී.කේ.එම්.ප්‍රනාන්දු මිය - ක.සේ.නි. ඩී.එම්.සී.ඩී. දිසානායක මිය - සං.නි.	2025.12.16 හා 17	26,000/-		දේශීය	රාජකාරි ස්වභාවය අනුව දැනුම යොදා ගෙන ඇත.

07. <u>අනුකූලතා වාර්තාව</u>

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ.		
1.6	වෙනත් - සමාගම් අරමුදල් ගිණුම	අනුකූල වේ.		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම.	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ.		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල නොවේ.	**2024 හා 2025 වර්ෂවල නිකුත්කල විගණන විමසුම් කිහිපයක් සඳහා පිළිතුරු ලබා දීමට ඇත.**	**කඩිනමින් පිලිතුරු සැපයීමට වගබලා ගැනීම.**
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ.		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණය චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අදාළ නොවේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල නොවේ.	**නියමිත කාලය තුළ සිදු කිරීමට නොහැකි වීම.**	**ඉදිරියේදී නියමිත කාලය තුළ සිදු කිරීමට වගබලා ගැනීම.**
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල නොවේ.	**දෛනික ධාවන සටහන් ලබා දීමේ අඩුපාඩු පැවතීම.**	**නිසිකලට දෛනික ධාවන සටහන් ලබාදෙන ලෙස දන්වා රියදුරන්ට අවවාද ලිපි නිකුත් කර ඇත.**
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය නැවත පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ.	**වාහනවල ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබීම.**	**ඉන්ධන දහන පරීක්ෂා කිරීමේ කටයුතු සිදු කිරීමට පියවර ගැනීම.**
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අදාළ නොවේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ.	**තවදුරටත් ගැලපුම් කළ යුතු ශේෂ තිබීම.**	**කඩිනමින් අදාළ නිරවුල් කිරීම් සිදු කිරීම.**
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම.			
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අදාළ වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ.		
13.2	පොදු තැන්පත් සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ.		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ.	**නිලධාරීන් නියමිත පිරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් නොකිරීම.**	**නියමිත පරිදි එම අතුරු අග්‍රිම පියවන ලෙස දැනුම් දීම.**
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ.		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ.	**පද්ධතිය තුලින් තොරතුරු ලබා ගැනීමට නොහැකි වීම.**	**පද්ධතිය තුලින් තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන අතර නව පද්ධතිය ස්ථාපිත**

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
				කිරීමේදී මේ පිළිබඳව තොරතුරු ලබා ගැනීමට හැකි පරිදි තවදුරටත් සංවර්ධනය කිරීම.
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ.	**සියළුම මාණ්ඩලික නිලධාරීන්, ආයතන හා ගිණුම් අංශ වල නිලධාරීන් සඳහා රාජකාරී ලැයිස්තු ලබා දී ඇත. සමාගම් අංශ වල නිලධාරීන් මාර්ගගත ක්‍රමය ඔස්සේ රාජකාරී කටයුතු සිදු කරනු ලැබේ.**	
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළකිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල නොවේ.	**පුරවැසි ප්‍රඥප්තිය සම්පාදනය කොට ඇතත් ප්‍රදර්ශනය කර ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.**	**කඩිනමින් එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.**
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ.	**පුරවැසි ප්‍රඥප්තිය ප්‍රදර්ශනය කර නොතිබීම නිසා එය ක්‍රියාත්මක කිරීමටත් අධීක්ෂණය කිරීමට හා ඇගයීමටත් ක්‍රමවේදයක් සකස් කර නොමැත.**	**ප්‍රදර්ශනය කළ වහාම අදාළ අධීක්ෂණ හැ ඇගයීම් කටයුතු සඳහා ක්‍රමවේදයක් සැකසීම.**
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අදාළ නොවේ.	2/2018(1) අනුව අදාළ නොවේ.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම			
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		